ජනවාරි
2019

# පෙර දැක්ම 2019

## 2019 සහ ඉදිරිය සඳහා මුදල් සහ මූල්‍ය අංශ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA



# පෙර දැක්ම:

# 2019 සහ ඉදිරිය සඳහා මුදල් සහ මූල්‍ය අංශ ප්‍රතිපත්ති


ඉදිරිපත් කිරීම

ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි

අධිපති

ශ්‍රී ලංකා මහ බැංකුව


*2019 ජනවාරි 02*

# 1. හැඳින්වීම

සම්භාවනීය අමුත්තනි, මුදල් මණ්ඩල සාමාජිකයිනි, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපතිතුමනි, නියෝජ්‍ය අධිපතිවරුනි, සහකාර අධිපතිවරුන් ඇතුළු ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරී මහත්ම මහත්මියනි, විශේෂ ආරාධිත අමුත්තනි, නෝනාවරුනි, මහත්වරුනි.

2019 වසර සහ ඉදිරි කාලය සඳහා වන මුදල් හා මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති දිශානතිය ප්‍රකාශයට පත් කරනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පෙර දැක්ම ඉදිරිපත් කිරීමේ අවස්ථාවට සපැමිණි ඔබ සියලු දෙනා සාදරයෙන් පිළිගනිමු.

අපගේ අනාගත ප්‍රතිපත්ති දිශානතිය පිළිබඳ ඔබ දැනුම්වත් කිරීමේ සම්ප්‍රදාය තවදුරටත් පවත්වාගෙන යමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පෙර දැක්මෙහි 12 වන ප්‍රකාශය ඉතා සතුටින් මෙලෙස ඔබ වෙත ඉදිරිපත් කරන්නෙමු. මෙම පෙර දැක්ම ඉහළ පිළිගැනීමක් සහිත, එමෙන්ම ආර්ථිකයේ සියලුම පාර්ශ්වකරුවන් හට ප්‍රතිලාභ ලබා දෙන වැදගත් ප්‍රතිපත්ති ප්‍රකාශනයක් ලෙස හඳුන්වා දිය හැකිය. මෙම පෙර දැක්ම මගින් ඔබගේ ප්‍රතිපත්ති හා සැලසුම් සඳහා ඵලදායී ලෙස මඟපෙන්වීමක් ලබාදෙන අතරම, එමගින් රටෙහි සමස්ත ආර්ථික වර්ධනය සහ මහජනතාවගේ ඉහළ ජීවන තත්ත්වය උදෙසා දායකත්වයක් ලැබෙනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

පළමුවෙන්ම, 2018 වසර තුළ ක්‍රියාත්මක වූ අපගේ ප්‍රතිපත්ති ස්ථාවරය සහ ආර්ථිකය පිළිබඳ විශ්ලේෂණයක් ඉදිරිපත් කරන්නෙමු. විදේශීය අංශය මත දැඩි බලපෑම් ඇති කරනු ලැබූ, ප්‍රධාන වශයෙන් ගෝලීය ආර්ථික, මූල්‍ය සහ භූදේශපාලනික තත්ත්ව හේතුවෙන් **2018 වසරේදී ශ්‍රී ලංකා ආර්ථිකය අභියෝග රැසකට මුහුණ දුන්නේය.** දේශීය අභියෝග රාශියක්ද පැවතිණි. විශේෂයෙන්ම, වසරේ අවසාන කාර්තුවේ දී ඇති වූ දේශපාලන අවිනිශ්චිතතාව සමස්ත සාර්ව ආර්ථික ස්ථාවරත්වයට ඇති අභියෝග තවත් දැඩි කළේය. 2017 වසරේ දී පැවති මන්දගාමී ආර්ථික වර්ධනය අඛණ්ඩව පැවති අතර, ඒ අනුව 2018 වසරේදී ද අඩු වර්ධනයක් වාර්තා විය. යහපත් කාලගුණික තත්ත්වය කෘෂිකාර්මික අංශය යථා තත්ත්වයට පත් කිරීමට උපකාරී වූ අතර, සේවා අංශයේ කටයුතු ද පුළුල් වර්ධනයක් වාර්තා කළේය. කෙසේ වුවද, 2018 වසරේදී ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පැවති මන්දගාමී ක්‍රියාකාරිත්වය හේතුවෙන් කාර්මික අංශයේ කටයුතුවල වර්ධනය අඩු විය. නිතර උච්චාවචනය වන ආහාර මිල

ගණන්වල සහ පරිපාලිත මිල ගණන්වල සංශෝධන හේතුවෙන් තාවකාලික වශයෙන් පැවති ඉහළ යෑම් හා පහළ යෑම් මධ්‍යයේ වුවද, 2018 වසරේදී පාරිභෝගික මිල උද්ධමනය අඩු මට්ටමක පැවතිණ. පසුගිය දෙවසර තුළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුගමනය කරන ලද දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට ප්‍රතිචාර දක්වමින්, 2016 සහ 2017 වසරවල වාර්තා වූ ඉහළ වර්ධනයට සාපේක්ෂව 2018 වසරේදී මුදල් සහ ණය වර්ධනය මන්දගාමී විය. පෞද්ගලික අංශය වෙතින් ණය සඳහා පැවති ඉල්ලුම පිළිබිඹු කරමින් දේශීය ණය ප්‍රමාණවත් ලෙස ප්‍රසාරණය විය.

මෙම ප්‍රවණතා මෙන්ම, ඉදිරියේදී ඇති විය හැකි අවදානම් සහ අභියෝග සැලකිල්ලට ගනිමින්, 2018 වසර තුළ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී අප විසින් පරීක්ෂාකාරී පිළිවෙතක් අනුගමනය කරන ලදී. උද්ධමනයෙහි සහ උද්ධමන අපේක්ෂාවල හිතකර වර්ධනයන් මෙන්ම, මූර්ත ආර්ථිකයේ මන්දගාමී වර්ධනය සැලකිල්ලට ගනිමින් 2015 වර්ෂයේ අවසානයේ සිට ක්‍රියාත්මක වූ දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයෙහි අවසානය සනිටුහන් කරමින්, 2018 අප්‍රේල් මාසයේදී ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවෙහි ඉහළ සීමාව පහත හෙළන ලදී. කෙසේ වුවද, විදේශීය අංශයේ ස්ථායීතාවට බලපෑ ගෝලීය සාධක සැලකිල්ලට ගනිමින් ඉන්පසුව, ශ්‍රී ලංකා මහ බැංකුව මධ්‍යස්ථ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් අනුගමනය කළේය.

දේශීය මුදල් වෙළඳපොළ තුළ අඛණ්ඩව පැවති රුපියල් ද්‍රවශීලතා හිඟය හේතුවෙන් වාණිජ බැංකුවල සියලුම රුපියල් තැන්පතු සඳහා අදාළ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය, 2018 නොවැම්බර් මාසයේදී පහත හෙළීමට මහ බැංකුවට සිදු විය. එමෙන්ම, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය පහත හෙළීම හේතුවෙන් ස්ථාවර පදනමක් මත ද්‍රවශීලතාව සැපයීම නිසා පොලී අනුපාතික මත ඇති වන බලපෑම සමනය කිරීම සඳහා ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීමට ද මහ බැංකුවට සිදු විය. උද්ධමනය මැදි තනි අගයක මට්ටමේ ස්ථායීව පවත්වා ගැනීම සහ උද්ධමන අපේක්ෂා පාලනය කිරීම තුළින් මැදිකාලීනව උපරිම නිෂ්පාදන මට්ටමට ආර්ථිකය ළඟා වීමේ පුළුල් ඉලක්කය සහිතව අප විසින් මෙලෙස පරීක්ෂාකාරී පිළිවෙතක් අනුගමනය කරන ලදී.

විදේශීය අංශය සලකා බලන විට, සංචාරක ඉපැයීම්, සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, විදේශීය සෘජු ආයෝජන සහ රජය වෙත ණය ලැබීම් යනාදිය ගෙවුම් ශේෂය මත පැවති පීඩනය යම්තාක් දුරකට අවම කළ ද, අපනයන ආදායම ඉක්මවා ආනයන වියදම් ඉහළ

ගියේය. ගෝලීය මූල්‍ය තත්ත්වය දැඩිවීම, විශේෂයෙන්ම ඇමෙරිකා එක්සත් ජනපදය සිය මුදල් ප්‍රතිපත්තිය ක්‍රමයෙන් දැඩි කිරීම හේතුවෙන් එක්සත් ජනපද ඩොලරය ශක්තිමත් වීමත් යනාදිය හේතුවෙන් විදේශ විනිමය රටින් ඉවතට ගලා යැමත්, වෙළඳ හිඟය පුළුල් වීමත් හේතුවෙන් ගෙවුම් ශේෂය මත සැලකිය යුතු පීඩනයක් ඇති විය. අනෙකුත් නැඟී එන වෙළඳපොළ ආර්ථිකයන් සහිත රටවල දක්නට ලද පීඩනයට සමානව, ශ්‍රී ලංකා රුපියල, විශේෂයෙන්ම, වසරේ දෙවන භාගයේදී දැඩි ලෙස අවප්‍රමාණයට ලක් විය. විදේශ විනිමය වෙළඳපොළ තුළ ඉල්ලුම සහ සැපයුම මගින් විනිමය අනුපාතිකයෙහි මට්ටම සහ දිශාව තීරණය වීමට ඉඩ හරින අතරතුර, විනිමය අනුපාතිකයේ අධික උච්චාවචන පැවති අවස්ථාවලදී එහි අහිතකර තත්ත්වය මගහැරවීම සඳහා මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපොළට මැදිහත් විය. විදේශීය අංශයේ බලපෑම් සමනය කිරීම සඳහා රජය සහ මහ බැංකුව විසින් කෙටිකාලීන පියවර කිහිපයක් හඳුන්වා දෙන ලද නමුත්, මැදි හා දිගුකාලීනව, විශේෂයෙන්ම, වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන වැඩි කිරීම සඳහා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සිදු කිරීමේ වැදගත්කම විදේශීය අංශයේ ප්‍රවණතා තුළින් නැවතත් අවධාරණය කෙරේ. 2018 වසරේ අවසාන භාගයේදී පැවති දේශපාලන අවිනිශ්චිතතාවද විදේශීය අංශයට බලපෑම් ඇති කළේය. ඉදිරි කාලය තුළ මැතිවරණ තත්ත්වයක් ඇතිවීම මගින් රාජ්‍ය අයවැය ඉලක්ක සපුරාගත නොහැකි වීමේ අවදානම ද ඇතුළු දේශපාලන අවිනිශ්චිතතා විශේෂයෙන් සැලකිල්ලට ගනිමින් ප්‍රධාන ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන තුන විසින්ම ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් පහත හෙළන ලදී. මෙය ආයෝජකයන්ගේ විශ්වසනීයත්වය කෙරෙහි සෘණාත්මක බලපෑම් ඇති කළේය. කෙසේ වෙතත්, එවැනි ශ්‍රේණිගත කිරීම් පහත හෙළීම හුදෙක් දේශපාලන අවිනිශ්චිතතා මත පමණක් පදනම් වූවක් වන අතර, සාර්ව ආර්ථික මූලධර්ම හෝ ප්‍රතිපත්තිවල පිරිහීමක් පිළිබඳ කිසිදු ස්ථිර සාක්ෂියක් නොපැවතීම හේතුවෙන් අපේක්ෂිත අයවැය ඉලක්ක සපුරාගත නොහැකි වීම යන අදහස සාධාරණීකරණය කළ නොහැක්කකි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනෙහි පස්වන සමාලෝචනය සම්පූර්ණ කිරීමේදී අවධානයට යොමුවූ 2018 ඔක්තෝබර් 26 දක්වා පැවති යහපත් ප්‍රගතියෙන් මෙම තත්ත්වය පැහැදිලි වේ. විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ ශ්‍රී ලංකාවට අඛණ්ඩව ණය පහසුකම් ලැබුණු අතර, 2018 ජූනි මාසයේදී එම වැඩසටහන යටතේ පස්වන වාරිකය ශ්‍රී ලංකාවට ලැබුණි. 2019 වසර තුළ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ සාර්ථකව නිම කිරීමට අපි බලාපොරොත්තු වෙමු. ඒ අනුව, පස්වැනි සමාලෝචනයේදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ එකඟ වී ඇති

කාර්ය මණ්ඩල ගිවිසුමේ එකඟතාව මීළඟ අදියර දක්වා ගෙන යෑමට අපි බලාපොරොත්තු වෙමු.

රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව උදෙසා රජය අඛණ්ඩව කටයුතු කළ ද, 2018 වසරේදී රාජ්‍ය මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය මිශ්‍ර කාර්ය සාධනයක් වාර්තා කළේය. ආදායම් රැස්කිරීම් අපේක්ෂිත මට්ටමට වඩා අඩුවීම හේතුවෙන් 2018 වසරේදී ඉලක්කගත අයවැය හිඟය ළඟා කර ගැනීම අභියෝගාත්මක වේ. කෙසේ වුවද, 2018 වසරේදී අඛණ්ඩව දෙවන වරටත් ප්‍රාථමික ගිණුම් ශේෂයේ අතිරික්තයක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙලෙස අතිරික්තයක් වාර්තා වනුයේ 1955 වසරින් පසු තුන්වන වතාවට වේ. රාජ්‍ය මූල්‍ය අංශය තුළ දැනටමත් අත්කර ගෙන ඇති යහපත් තත්ත්වය ඉදිරියට පවත්වා ගැනීම සඳහාත්, රාජ්‍ය මූල්‍ය කටයුතු මගින් ඇතිවන අවහිරතාවලින් තොරව මුදල් හා විනිමය අනුපාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහාත්, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ.

පසුගිය වසරේ පෙර දැක්මෙහි ප්‍රකාශයට පත් කළ පරිදි, 2020 වසර වන විට ශ්‍රී ලංකා මහ බැංකුවේ නව මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය (Flexible Inflation Targeting/FIT) හඳුන්වා දීම සඳහා අපි කටයුතු කරමින් සිටිමු. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය වෙත යොමු වීම සඳහා 2018 වසර තුළදී ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගණනාවක් අප විසින් ගෙන ඇත. රජය සමඟ මනා ප්‍රතිපත්ති සහයෝගීතාවක් පවත්වා ගෙන යමින්, මහ බැංකුවේ ස්වාධීනත්වය, විනිවිදභාවය සහ වගවීම ශක්තිමත් කරන අතරම, අඩු උද්ධමන මට්ටමක් පවත්වාගෙන යෑම සඳහා මහ බැංකුවේ බලතල ශක්තිමත් කිරීමට අවශ්‍ය කරනු ලබන නීතිමය සංශෝධන සකස් කිරීම අප විසින් ආරම්භ කර ඇත.

ගෝලීය සහ දේශීය කම්පනයන්ට ඔරොත්තු දීම සඳහා මූල්‍ය පද්ධතිය සතු හැකියාව වැඩිදියුණු කරමින් සහ අවම සාර්ව විචක්ෂණ අවදානම් සහිතව ස්ථාවර මූල්‍ය පද්ධතියක් පවත්වා ගැනීමේ අරමුණ ඇතිව ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගණනාවක් 2018 වසරේදී ක්‍රියාත්මක කිරීමට අපට හැකිවිය. මූල්‍ය ආයතනවල නෛතික හා නියාමන රාමුව ශක්තිමත් කිරීම සඳහා නව බැංකු පනතක් කෙටුම්පත් කරමින් පවතින අතර, මූල්‍ය අංශයට අදාළ අනෙකුත් නීති සංශෝධනය කිරීමද ආරම්භ කර ඇත. ගැටලුකාරී සමාගම් සඳහා නිරාකරණ ක්‍රියාමාර්ග ලෙස ව්‍යාපාර සීමා කිරීම මෙන්ම, බලපත්‍ර අත්හිටුවීම සහ අවලංගු කිරීම වැනි දැඩි නියාමන ක්‍රියාමාර්ග ගන්නා ලදී. බැංකු හා බැංකු නොවන මූල්‍ය අංශවල ප්‍රාග්ධන අවශ්‍යතාව ක්‍රමිකව

ඉහළ නැංවීම තුළින් එම ආයතන අතර ඒකාබද්ධවීමේ ක්‍රියාවලියකට අප විසින් අනුබල දෙනු ඇත. විධිමත් අයුරින් බැංකු හා බැංකු නොවන අංශවල ව්‍යුහ ශක්තිමත්ව නඟා සිටුවීමට ප්‍රමුඛතාව දෙනු ඇත. අපගේ අභිප්‍රාය වනුයේ නියාමන අවහිරතා හා දුර්වලතාවලින් තොරව කටයුතු කළ හැකි බව මූල්‍ය වෙළඳපොළට සන්නිවේදනය කිරීමයි.

වර්ධනය වන ගෙවීම් අවශ්‍යතා සපුරාලීම සඳහා කාර්යක්ෂම හා ස්ථාවර ජාතික ගෙවීම් හා පියවීම් පද්ධතියක් සකස් කිරීමේ ව්‍යවස්ථාපිත වගකීම ඉටු කරමින් අප විසින් ගෙවීම් හා පියවීම් යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සඳහා පියවර රැසක් ගන්නා ලදී. රට තුළ ඩිජිටල් ගෙවීම් යාන්ත්‍රණයක් ප්‍රවර්ධනය කිරීම සඳහා 2018 වසරේ දී QR කේත (QR Code) පදනම් කරගත් ගෙවීම් සඳහා ජාතික ප්‍රමිතියක් හඳුන්වා දුන් අතර, ජාතික කාඩ්පත් ක්‍රමයක් ස්ථාපිත, කිරීමට අදාළව ප්‍රගතියක් අත්කර ගෙන ඇත. සංසරණයෙහි පවතින මුදල් නෝට්ටුවල ගුණාත්මක තත්ත්වය ආරක්ෂා කිරීම සඳහා පියවර ගන්නා ලද අතර, ආර්ථිකය තුළ ගනුදෙනු ක්‍රමවත්ව සිදුකිරීමට පහසුකම් සැලසීම සඳහා ව්‍යවහාර මුදල් කළමනාකරණ කටයුතුද අඛණ්ඩව සිදු කළෙමු.

2018 වසරේදී ශ්‍රී ලංකා මහ බැංකුව නියෝජිත කාර්යයන් ශක්තිමත් කිරීම සඳහා ද ප්‍රමුඛතාව ලබා දෙන ලදී. රාජ්‍ය ණය තිරසාරත්වය පවත්වා ගැනීමට ඉලක්ක කරන අතර, අඩු අවදානම් මට්ටමක් සහිතව අවම පිරිවැයක් යටතේ රජයේ මූල්‍ය අවශ්‍යතා සපුරාලන පරිදි රාජ්‍ය ණය කළමනාකරණය සිදු කරන ලදී. රජයේ සුරැකුම්පත් නිකුතු සඳහා වන වෙන්දේසි ක්‍රමයෙහි විනිවිදභාවය හා කාර්යක්ෂමතාව පවත්වා ගැනීම සඳහා මෙන්ම, ස්ථාවර හා මැදිකාලීන ණය කළමනාකරණ උපාය මාර්ගයක් සකස් කිරීම පිළිබඳ අඛණ්ඩව අවධානය යොමු විය. රජයේ ද එකඟතාව සහිතව අලුතින් ක්‍රියාවට නංවන ලද සක්‍රීය වගකීම් කළමනාකරණ පනත පදනම් කොට ගෙන අනාගත ණය ලබා ගැනීම් පිළිබඳ වගකීම් කළමනාකරණය කිරීමේ වැඩපිළිවෙළක් ආරම්භ කරන ලදී.

2017 අංක 12 දරන විදේශ විනිමය පනත හඳුන්වා දීමත් සමඟ විදේශ විනිමය ගනුදෙනු ලිහිල්කරණය වැඩිදියුණු විය. ආයෝජන සඳහා අරමුදල් සුමට ලෙස ගලා යෑම පිණිස ප්‍රාග්ධන ගලා ඒම් තවදුරටත් ලිහිල් සහ විධිමත් කිරීමේ ක්‍රියාමාර්ග ගන්නා ලද අතර, දේශීය ආයෝජකයන් හට ජාත්‍යන්තර වෙළඳපොළ වෙත ප්‍රවිශ්ට වීම සඳහා තෝරාගත් අංශවල ප්‍රාග්ධනය පිටතට ගලා යෑම් සඳහා පවතින සීමා පුළුල් කරන ලදී.

සර්වසම සහ තුලනාත්මක ආර්ථික වර්ධනයක් සහ රටෙහි මූල්‍ය අන්තර්ගතභාවය වැඩිදියුණු කිරීමේ පුළුල් අරමුණ ඇතිව 2018 වසරේදී පහසුකම් සපයන්නෙකු ලෙස මහ බැංකුව සිය සංවර්ධන මූල්‍ය හා ප්‍රාදේශීය සංවර්ධන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන ගියේය. අප විසින් ජාතික මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ උපාය මාර්ගික සැලසුම් (National Financial Inclusion Strategy) සකස් කිරීමෙහිලා ප්‍රගතියක් ලබා ගෙන ඇත. තවද, ජාත්‍යන්තර වශයෙන් ශ්‍රී ලංකාවේ තත්ත්වය වැඩිදියුණු කිරීමේ අරමුණු ඇතිව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය සඳහා අරමුදල් සැපයීම වැළැක්වීම සඳහා වන නියාමන ක්‍රියාත්මක කිරීම වැඩිදියුණු කිරීම සිදු කරන ලද අතර, 2018 වසරේදී රාජ්‍ය ආයතන කිහිපයක් සමඟ නව අවබෝධතා ගිවිසුම්වලට එළැඹිණ. 2019 වසරේ මැද වන විට ශ්‍රී ලංකාව, මූල්‍ය කාර්ය සාධක බලකායේ "අළු ලේඛනයෙන්" (FATF Grey List) ඉවත් කර ගැනීමට අවශ්‍ය කරනු ලබන කටයුතු අපි සිදු කරමින් සිටිමු.

ඉහළ වගවීමක් සහ විනිවිදභාවයක් ඇති කිරීමෙහිලා ක්‍රියාමාර්ග ගණනාවක් අප විසින් ගෙන ඇත. විශේෂයෙන්ම, භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳ පරීක්ෂා කිරීමේ සහ විමර්ශනය කිරීමේ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ නිර්දේශ අනුගමනය කරමින්, මහ බැංකුවට අදාළ නෛතික රාමුව ශක්තිමත් කිරීම සඳහා පියවර ගනිමින් සිටිමු. රජයේ සුරැකුම්පත් නිකුත් කිරීමට අදාළ මෙහෙයුම් ක්‍රියාවලිය සංශෝධනය කිරීම, සේවක අර්ථසාධක අරමුදල සඳහා නව ආයෝජන ප්‍රතිපත්ති රාමුවක් හඳුන්වා දීම, අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීම සහ මහ බැංකු සේවකයන් හා මුදල් මණ්ඩලයේ සාමාජිකයන් හට චර්යා ධර්ම සංග්‍රහයක් හඳුන්වා දීම සඳහා දැනටමත් පියවර ගෙන ඇත. වෝහාරික විගණන කටයුතු සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය දැනටමත් සිදු කෙරෙමින් පවතින අතර, මෙම වෝහාරික විගණන ජාත්‍යන්තර පරිචයන් සහිත ආයතන විසින් සිදු කරනු ලබනු ඇත.

අභියෝගාත්මක ගෝලීය සහ දේශීය පරිසරයක් තුළ, පවතින අවදානම් අවම කිරීමට සහ එමගින් සිය මූලික අරමුණු වන ආර්ථික සහ මිල ස්ථායීතාව සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව අත්කර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සිය ප්‍රතිපත්ති රාමු ක්‍රමයෙන් වැඩිදියුණු කරමින් සිටී. අපගේ කටයුතුවල ඵලදායීතාව සහ එහි අපේක්ෂිත ප්‍රතිඵල යම් කොන්දේසි හා අවශ්‍යතා සපුරාලීම මත තීරණය වන අතර, විශේෂයෙන්, සාර්ව ආර්ථික ස්ථායීතාව සඳහා රජය දක්වන කැපවීම අවශ්‍ය වේ. පවතින අඩු ආර්ථික වර්ධන තත්ත්වය තුළ, වර්ධනය ඉහළ නැංවීම සඳහා අදාළ වන ප්‍රතිපත්ති මෙන්ම, ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ කෙරෙහිද රජයේ ප්‍රමුඛතාව

යොමුවීම ඉතා අවශ්‍ය වේ. කෙසේ වෙතත්, එය රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලියට බාධා නොවන පරිදි සිදු කළ යුතුය. මේ සඳහා වැඩි කාර්යභාරයක් සිදු කළ හැකි හිතකර පරිසරයක් පෞද්ගලික අංශය සඳහා සකස් කර දිය යුතුය. එමෙන්ම, රජයේ ස්ථාවර හා පුරෝකථනය කළ හැකි ප්‍රතිපත්ති පැවතීම මෙන්ම, වඩාත් ගතික සහ ව්‍යවසායික මානසිකත්වයක් ව්‍යාපාර අංශයෙහි පැවතීම මේ සඳහා අත්‍යවශ්‍ය වේ.

අඩු උද්ධමනකාරී වාතාවරණයක් පවත්වා ගනිමින් සහ ඉහළ සහ තිරසාර ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීම සඳහා රටේ සමාජ සහ ආර්ථික යටිතල පහසුකම් වර්ධනය කිරීම, ඵලදායීතාව ඉහළ නැංවීම, ශ්‍රම බලකායේ කුසලතා ඉහළ නැංවීම මෙන්ම, දේශීය නිෂ්පාදන ධාරිතාව වැඩිදියුණු කිරීම යනාදිය රජයේ ක්‍රියාමාර්ගවල ප්‍රමුඛ අරමුණු වේ. එබඳු ප්‍රතිපත්ති තුළින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නම් එම ප්‍රතිපත්ති ස්ථිර මෙන්ම මනා සම්බන්ධීකරණයකින්ද එකිනෙකට ගැළපෙන අයුරකින් හා කාලීනව ක්‍රියාත්මක විය යුතු වේ. මෙම පසුබිම තුළ, රජයේ සහ පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන්ගේද සහාය ඇතිව සාර්ව ආර්ථික ස්ථායීතාව ළඟා කර ගැනීමට අවශ්‍ය කරනු ලබන ශක්තිමත් සහ විශ්වසනීය ප්‍රතිපත්ති රාමු සැකසීම සඳහා පදනම යෙදීම මෙම පෙර දැක්ම තුළින් අපේක්ෂා කෙරේ.

2019 ප්‍රතිපත්ති පෙර දැක්මෙහි පෙළගැස්ම පහත සඳහන් පරිදි වේ:

| | | |
|---|---|---|
| **2 වන කොටස** | : | 2019 වසර සහ ඉදිරිය සඳහා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති උපායමාර්ගය සහ ප්‍රතිපත්ති |
| **3 වන කොටස** | : | 2019 වසර සහ ඉදිරිය සඳහා මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය සහ ස්ථාවරත්වය සඳහා අදාළ වන මහ බැංකු ප්‍රතිපත්ති |
| **4 වන කොටස** | : | මහ බැංකුවේ නියෝජිත කාර්යයන් සඳහා අදාළ ප්‍රතිපත්ති |

මෙම එක් එක් අංශ පිළිබඳව සවිස්තරාත්මකව විග්‍රහ කිරීමක් මෙතැන් සිට සිදු කෙරේ.

## 2. 2019 වසර සහ ඉදිරිය සඳහා මුදල් ප්‍රතිපත්ති උපාය මාර්ගය සහ ප්‍රතිපත්ති

මැදිකාලීන වශයෙන් උද්ධමනය අඩු හා ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම මගින් ආර්ථිකයට එහි උපරිම වර්ධන මට්ටම කරා ළඟාවීම සඳහා සහාය වීමේ අරමුණ පෙරදැරිව ශ්‍රී ලංකා මහ බැංකුව ඉදිරි දැක්මකින් යුතුව සිය **මුදල් ප්‍රතිපත්තිය** ක්‍රියාත්මක කරයි.

ශීඝ්‍රයෙන් වෙනස් වන අහිතකර ගෝලීය තත්ත්ව මෙන්ම, දේශීය වශයෙන් පැවති හිතකර මෙන්ම අහිතකර අවදානම් සහිත අභියෝගාත්මක පරිසරයක් තුළ 2018 වසරේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිය මුදල් ප්‍රතිපත්තිය මෙහෙයවනු ලැබීය. ඇමෙරිකා එක්සත් ජනපදයේ පොලී අනුපාතික ඉහළ නැංවීමත් සමඟ ගෝලීය ආර්ථිකයේ ඇතිවූ නව ප්‍රවණතා සහ බොහෝ දියුණු රටවල මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීමට ප්‍රතිචාර වශයෙන් ලොව පුරා මහ බැංකුවලට සිය මුදල් ප්‍රතිපත්තිය හැඩගස්වා ගැනීමට සිදු විය. ප්‍රාග්ධනය පිටතට ගලා යෑම සහ වෙළඳ හිඟය පුළුල් වීම හේතුවෙන් විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම, අඩු ආර්ථික වර්ධනය, මුදල් සහ ණය සමස්තවල මන්දගාමී වීම, මධ්‍යස්ථ මට්ටමේ උද්ධමනය මෙන්ම, මුදල් වෙළඳපොළ තුළ පැවති අඛණ්ඩ ද්‍රවශීලතා හිඟය වැනි දේශීය වශයෙන් පැවති තත්ත්ව සැලකිල්ලට ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුවට සිදුවිය.

ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සහ ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීම මගින් 2015 වසර අවසානයේ සිට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුගමනය කරන ලද දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය හේතුවෙන්, විශේෂයෙන්ම ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය සම්බන්ධයෙන් සහ 2016 හා 2017 වසරවලට සාපේක්ෂව මුදල් හා ණය සමස්ත පිළිබඳ අපේක්ෂිත හිතකර ප්‍රතිඵල ලබා ගැනීමට හැකිවිය. දුර්වල ආර්ථික වර්ධන පරිසරයක් තුළ මෙවැනි ප්‍රවණතා, විශේෂයෙන්, උද්ධමනය, උද්ධමන අපේක්ෂා සහ මුදල් අංශයෙහි ප්‍රවණතා ඇතුළු යහපත් වර්ධනයන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අවසන් කිරීම සඳහා මඟ පෑදූ අතර, ඒ අනුව 2018 අප්‍රේල් මස මුලදී නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 25 කින් පහත හෙළීමට මහ බැංකුව කටයුතු කළේය. කෙසේ වෙතත්, ගෝලීය ආර්ථික තත්ත්ව සහ විනිමය අනුපාතිකය මත වූ බලපෑම් හේතුවෙන් 2018 අප්‍රේල් මාසයේ සිට මධ්‍යස්ථ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් පවත්වා ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුවට සිදු විය.

මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් තුළ, වෙළඳපොළ පදනම් වූ ප්‍රතිපත්ති උපකරණ, විශේෂයෙන්ම, ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ විවට වෙළඳපොළ කටයුතු බහුලව භාවිතා කරන ලද අතර, ස්ථාවර පදනමක් මත වෙළඳපොළ වෙත ද්‍රවශීලතාව සැපයීම සඳහා වන උපකරණයක් ලෙස ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය භාවිත කරන ලදී. දේශීය මුදල් වෙළඳපොළ තුළ රුපියල් ද්‍රවශීලතාවයෙහි පවතින අඛණ්ඩ සහ ඉහළ හිඟය හේතුවෙන්, 2018 නොවැම්බර් මාසයේදී වාණිජ බැංකුවල සියලුම රුපියල් තැන්පතු වගකීම්වලට අදාළ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය, සියයට 7.50 සිට සියයට 6.00 දක්වා අඩු කිරීමට මුදල් මණ්ඩලය තීරණය කළේය. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය අඩු කිරීම මගින් බැංකු පද්ධතිය වෙත සැලකිය යුතු ද්‍රවශීලතාවක් මුදා හරින ලද අතර, ඒ හේතුවෙන් පොලී අනුපාතික පහළ යෑම සහ අධි සමස්ත ඉල්ලුමක් ඇති වීමට ඉඩ තිබුණි. එබැවින්, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය පහත හෙළීමෙහි බලපෑම සමනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිපත්ති පොලී අනුපාතික ද ඉහළ නංවන ලදී.

නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය වෙත යොමු වීම නිවේදනය කිරීමෙන් පසුව, විදේශීය හා දේශීය අංශවලින් පැන නඟින විවිධ ඉල්ලුම් සහ සැපයුම් කම්පන හේතුවෙන් ඇතැම් අවස්ථාවලදී උද්ධමනය ඉහළ හා පහළ ගියද, සමස්තයක් ලෙස ගත් කල උද්ධමනය අඩු මට්ටමක පවත්වාගෙන යෑමට අපට හැකියාව ලැබිණි. සාර්ව විචක්ෂණශීලී ක්‍රියාමාර්ග (Macroprudential Measures) කිහිපයකම සහාය ද ඇතිව විචක්ෂණ සහ පූර්වෝපායික වශයෙන් ගනු ලැබූ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල බලපෑමෙන් මුදල් ප්‍රසාරණය අපේක්ෂිත මට්ටම්වල පවත්වා ගෙන ගිය අතර, 2018 වසර තුළදී උද්ධමනය අඩු මට්ටමක පවත්වා ගෙන යෑමට එය සහාය විය.

ඔබ දන්නා පරිදි, පුරා දශකයක කාලයක් තුළ උද්ධමනය තනි අගයක මට්ටමේ පවත්වාගෙන යමින් ශ්‍රී ලංකා මහ බැංකුව විශේෂ වාර්තාවක් තබා ඇත. මහජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමේ අරමුණින් ඉහළ ආර්ථික වර්ධන මාවතක් ළඟා කර ගැනීමට අවශ්‍ය හිතකර පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ඉතා වැදගත් වන මිල ස්ථායීතාව ඇති කිරීමෙහිලා මහ බැංකුවේ දැඩි කැපවීම මින් පෙන්නුම් කෙරේ. අනාගතයේ අප හට මුහුණ දීමට සිදුවන දේශීය සහ විදේශීය අභියෝග මධ්‍යයේ වුවද, මෙතෙක් අත්කර ගනු ලැබූ අඩු උද්ධමන වාතාවරණය ඉදිරියටත් අඛණ්ඩව නොවෙනස්ව පවත්වා ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කරනු ඇත.

ශීඝ්‍රයෙන් වෙනස්වන සහ ඉහළ අවිනිශ්චිත සහගත වාතාවරණය මධ්‍යයේ, තිරසාර මිල ස්ථායීතාවක් පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවට පවතින හැකියාව තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණු ඇතිව, මුදල් ප්‍රතිපත්ති රාමුව වැඩිදියුණු කිරීමේ වැඩපිළිවෙළක් ආරම්භ කිරීමේ ප්‍රධානතම හේතුව මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීමේ අවශ්‍යතාවයි. ශ්‍රී ලංකා මහ බැංකුවෙහි බලතල ශක්තිමත්ව ස්ථාපිත කිරීමේ අරමුණු ඇතිව මුදල් නීති පනත සඳහා අවශ්‍ය සංශෝධන සිදු කිරීමට කටයුතු කිරීම, සඵලදායී රාජ්‍ය මූල්‍ය හා මුදල් ප්‍රතිපත්ති සම්බන්ධීකරණයක් ඇති කිරීම සහ තාක්ෂණික හා ආයතනික ශක්‍යතා තවදුරටත් වැඩිදියුණු කිරීම ඇතුළු ක්‍රියාමාර්ග රැසක් ක්‍රියාවට නංවමින් නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය වෙත නැඹුරුවීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් 2018 වසර තුළදී කැපී පෙනෙන ප්‍රගතියක් අත්කර ගැනීමට හැකිවිය.

නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය වෙත නැඹුරුවීමේ ක්‍රියාවලියෙහි ප්‍රගතිය හා සබැඳුණු වැදගත් අංශ කිහිපයක් පිළිබඳ වැඩිදුර කරුණු දැක්විය හැකිය. මිල ස්ථායීතාවට අදාළ ප්‍රධාන කාර්යභාරය ඉටු කිරීමේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ බලතල ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව සහ වැදගත්කම පෙර වසරේදී අපි අවධාරණය කළෙමු. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව වෙත සාර්ථකව නැඹුරුවීම සඳහා වූ ඉතා වැදගත් පූර්ව අවශ්‍යතාවක් ලෙස ශක්තිමත් නෛතික බලතල පද්ධතියක් පැවතීම අත්‍යවශ්‍ය කරුණක් බව සියලු දෙනා පිළිගනු ලබන අතර, එය මුදල් ප්‍රතිපත්ති රාමුව පදනම් වන ප්‍රධානතම සාධකය වේ. මේ නිසා ශ්‍රී ලංකා මහ බැංකුවේ යහපාලනය වැඩිදියුණු කිරීම, මූල්‍ය අංශයේ අධීක්ෂණය සවිමත් කිරීම සහ රාජ්‍ය මූල්‍ය හා මුදල් ප්‍රතිපත්ති සම්බන්ධීකරණය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය සංශෝධන සිදු කිරීමට අමතරව, විශේෂයෙන්ම, ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්වාධීනත්වය වැඩිදියුණු කිරීම සහ මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව හඳුන්වා දීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා ඉතා වැදගත් පියවරක් ලෙස මුදල් නීති පනත සඳහා පුළුල් සංශෝධන සිදු කිරීමට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා ලදී. ඒ අනුව, දිගුකාලීනව ගැටලුවක්ව පවත්නා මහ බැංකුවේ මූලික නොවන සහ රාජ්‍ය මූල්‍ය කටයුතු හා සබැඳුණු ඇතැම් ක්‍රියාකාරකම්, රාජ්‍ය මූල්‍ය මූල්‍යයනය යනාදියට විසඳුම් සපයන අතර, මුදල් ප්‍රතිපත්තිවලට අදාළ බලතල සහ ක්‍රියාකාරකම් පැහැදිලිව දැක්වීම තුළින් මහ බැංකුවේ ස්වාධීනත්වය තහවුරු කෙරෙන පරිදි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නීති විශේෂඥයන්ගේ සහයෝගයද සහිතව මුදල් නීති පනතෙහි සිදුකෙරෙන සංශෝධන අවසන් අදියරෙහි පවතී. මීට අමතරව, මිල ස්ථායිතාව ළඟා කර ගැනීමට කටයුතු කිරීම මහ බැංකුවේ ප්‍රමුඛතම අරමුණ

බවට පත්වනු ඇත. උද්ධමන ඉලක්කකරණය ස්ථාපිත කිරීමට අවශ්‍ය ආයතනික සැකැස්මට සහාය වීම සහ සාර්ව විචක්ෂණ උපකරණ මෙන්ම, මුදල් මෙහෙයුම් කටයුතු වර්ධනය කිරීමටද මෙම සංශෝධිත නීති රාමුව මගින් පහසුකම් සලසනු ලැබේ. මෙම සංශෝධන මගින් සමස්ත බලතලවල නිශ්චිත බව වැඩිදියුණු කරනු පමණක් නොව, මහ බැංකුවේ විනිවිදභාවය සහ වගවීම ඉහළ නැංවීම මෙන්ම, ඉහළ ස්වාධීනත්ව සහ යහපාලන රාමුවක් තුළින් ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්වසනීයත්වයද ඉහළ නැංවෙනු ඇත. මුදල් නීති පනත සඳහා වන සංශෝධන මෙම වසර තුළ දී කැබිනට් මණ්ඩලය සහ පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අපි අපේක්ෂා කරන්නෙමු.

නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය වෙත නැඹුරුවීමේ ක්‍රියාවලියෙහි තවත් එක් වැදගත් අංගයක් ලෙස ඉදිරි දැක්මකින් යුතුව මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ශක්තිමත් රාමුවක් ස්ථාපිත කිරීම පිණිස පද්ධති සහ ක්‍රියාවලීන් වර්ධනය කිරීම මෙන්ම, අපගේ කාර්ය මණ්ඩල කුසලතා, හැකියාවන් සහ ධාරිතාව වර්ධනය කිරීම දැක්විය හැකිය. මින් සිව් වසරකට පෙර ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ එක්ව මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා ආකෘති අනුව ගොඩනංවන ලද පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතියක් (Forecasting and Policy Analysis System – FPAS) ස්ථාපනය කිරීමේ කටයුතු ඇරඹීම මෙහි ප්‍රධාන පියවරක් ලෙස දැක්විය හැකිය. මේ සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ගවල සැලකිය යුතු ප්‍රගතියක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව තුළ ආකෘතිකරණ සහ පුරෝකථන හැකියාවන් වර්ධනය කිරීම හා එමගින් ඉදිරි දැක්මකින් යුතුව මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම දැක්විය හැකිය. මෙම ආකෘතිකරණ රාමුව පිළිබඳ තොරතුරු මේ වන විට මහජනතාවට ද දැන ගත හැකි ලෙස ප්‍රසිද්ධියට පත්කොට ඇත. සාර්ව ආර්ථික විශ්ලේෂණය සඳහා ඉවහල් වන කාලීන සහ විශ්වසනීය ආකෘති මත පදනම් වූ පුරෝකථන සඳහා උපකාරී වන, තාක්ෂණික හැකියාව සහ යටිතල පහසුකම් ඉදිරියේදී තවදුරටත් වර්ධනය කරලීම සඳහා සම්පත් යෙදවීමට ශ්‍රී ලංකා මහ බැංකුව අවධානය යොමු කරයි. මුදල් ප්‍රතිපත්ති විශ්ලේෂණය සඳහා උපකාරී වන නව සමීක්ෂණ ගණනාවක් සහ දර්ශක රාශියක් හඳුන්වා දීමට ශ්‍රී ලංකා මහ බැංකුව මේ වන විටත් සැලසුම් කර ඇත. පවත්නා දත්ත රැස්කිරීමේ සහ දත්ත සම්පාදනය කිරීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමට අපි තවදුරටත් කටයුතු කරමු. නිෂ්පාදන ප්‍රවණතා ආශ්‍රිත පෙර විපරම් දර්ශක හඳුන්වාදීම, මිල දර්ශක වැඩිදියුණු කිරීම, ඉහළ අවධානයක් අවශ්‍ය වන අංශ ආවරණය වන පරිදි ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය වැඩිදියුණු කිරීම සහ ඩිජිටල්කරණ ක්‍රියාවලීන් කිහිපයක්

ආරම්භ කිරීම මෙම සැලසුම්වලට ඇතුළත් වේ. ආවරණ කලාපය පුළුල් කිරීම සහ නිරවද්‍යතාව වැඩිදියුණු කිරීමේ අරමුණ සහිතව, දීප ව්‍යාප්ත දත්ත එක්රැස් කිරීමේ වැඩපිළිවෙළ හරහා කුටුම්භ අංශයේ උද්ධමන අපේක්ෂා සමීක්ෂණය කොළඹ දිස්ත්‍රික්කයට පමණක් සීමා නොවී තවදුරටත් ව්‍යාප්ත කිරීමේ ක්‍රියාවලියක මේ වන විටත් අපි නියැළී සිටිමු.

පෙර අවස්ථා කිහිපයකදීම අවධාරණය කර ඇති පරිදි, මුදල් ප්‍රතිපත්ති රාමුව වශයෙන් නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය හඳුන්වා දීමේ දී රජයේ ශක්තිමත් සහයෝගය සහ කැපවීම අත්‍යවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ අනාගත මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය රජය විසින් මේ වන විටත් පිළිගෙන ඇති අතර, මැදි කාලීනව හා දිගු කාලීනව රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය අරමුණු කර ගත් ප්‍රතිපත්ති මේ වන විටත් ක්‍රියාත්මක කරමින් පවතින බව සතුටින් ප්‍රකාශ කළ හැකිය. රජයේ වියදම් තාර්කීකරණය කරන අතරම, රාජ්‍ය ආදායම් ඉහළ නැංවීමේ අරමුණ සහිතව ආදායම් පදනම් කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලියක් සඳහා වූ රජයේ කැපවීම අපගේ ඇගයුමට ලක්වේ. නව දේශීය ආදායම් පනතක් ක්‍රියාවට නැංවීම, ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතියෙහි (RAMIS) පූර්ණ වශයෙන් ක්‍රියාත්මකවීමේ සහාය ඇතිව බදු පරිපාලනය වැඩිදියුණු කිරීම සහ බදු අනුකූලතාව වැඩිදියුණු කිරීම, ආදායම් ඉහළ නැංවීමට හේතු වනු ඇතැයි අපි අපේක්ෂා කරන්නෙමු. මීට අමතරව, වියදම් තාර්කීකරණයට අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුන්වා දීම, 2018 අංක 8 දරන සක්‍රීය වගකීම් කළමනාකරණ පනත බලාත්මක කිරීම තුළින් රාජ්‍ය ණය කළමනාකරණය ශක්තිමත් කිරීම සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම මෙන්ම, විදේශීය විනිමය වගකීම්වල අවදානම් අවම කිරීම අරමුණු කර ගනිමින් මැදි කාලීන ණය කළමනාකරණ උපායමාර්ගය සවිබලගැන්වීම, රජය විසින් ගෙන ඇති දිරිගන්වන සුළු ක්‍රියාමාර්ග වේ.

වෙනත් රටවල අත්දැකීම් හා සමානවම, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ උද්ධමන ඉලක්ක තීරණය කිරීම රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව එක්ව සාමූහිකව සිදු කිරීමට අපේක්ෂා කෙරේ. එසේ හෙයින්, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව සඳහා මෙම ආයතන දෙක සහයෝගීව කටයුතු කිරීම අවශ්‍ය වන අතර, මුදල් සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අතර නොගැළපීම් නොපැවතිය යුතුවේ.

මුදල් වෙළඳපොළ තුළ ද්‍රවශීලතාව කළමනාකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සක්‍රීයව විවට වෙළඳපොළ කටයුතු අඛණ්ඩව කරනු ලබන අතර, එමගින් ඉලක්කගත පරාසය තුළ උද්ධමනය පවත්වා ගැනීම සඳහා උපකාරී වන ප්‍රධාන මෙහෙයුම් ඉලක්කය වන කෙටිකාලීන වෙළඳපොළ පොලී අනුපාතික අපේක්ෂිත පරිදි හැසිරවීම සිදුවේ. විවට වෙළඳපොළ කටයුතු යනු ප්‍රතිපත්ති ස්ථාවරය සමඟ කෙටිකාලීන වෙළඳපොළ පොලී අනුපාතික ගැළපීම සඳහා අවශ්‍ය වන වෙළඳපොළ ද්‍රවශීලතාව කළමනාකරණය කිරීමේ උපායමාර්ගයක් වන අතර, එය ඇතැම් විශ්ලේෂකයන් විසින් සාවද්‍ය ලෙස අර්ථකථනය කරනු ලබන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම හෝ රඳවා තබා ගැනීම තුළින් නව මුදල් අච්චු ගැසීමේ යාන්ත්‍රණයක් නොවන බව අවධාරණය කළ යුතුය. මහ බැංකු විසින් සිදු කරනු ලබන මෙවැනි විවට වෙළඳපොළ කටයුතු සහ මහ බැංකු විසින් රජය වෙනුවෙන් නිකුත් කරනු ලබන භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම තුළින් රාජ්‍ය මූල්‍ය හිඟය මූල්‍යායනය කිරීම අතර පැහැදිලි වෙනසක් පවතී. තවද, වෙළඳපොළ සහභාගී වන්නන් හට තොරතුරු වැඩි වශයෙන් ලබා දීමට අවශ්‍ය කරනු ලබන ක්‍රියාමාර්ග කිහිපයක් අප විසින් ගනු ලැබූ අතර, එමගින් මූල්‍ය වෙළඳපොළ තුළ කාර්යක්ෂම මිල අනාවරණය කිරීමේ ක්‍රියාවලියක් සඳහා පහසුකම් සැලසෙනු ඇත. 2018 වසරේ ජනවාරි මාසයේදී මධ්‍යම ඒකාබද්ධ වෙළඳපොළ අධීක්ෂණ පද්ධතියක් (Central Integrated Market Monitor-CIMM) හඳුන්වා දෙන ලදී. මෙම පද්ධතිය මගින් ඒක්ෂණ මුදල් වෙළඳපොළ, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ සහ විදේශ විනිමය වෙළඳපොළ තුළ ඇති වැදගත් තොරතුරු රාශියක් එක්රැස් කර ගනු ලැබේ. මධ්‍යම ඒකාබද්ධ වෙළඳපොළ අධීක්ෂණ පද්ධතිය හරහා ද්‍රවශීලතාව වාර්තා කරනු ලබන පද්ධතියක් ස්ථාපිත කිරීමත් සමඟ දෛනික ද්‍රවශීලතා පුරෝකථනය තවදුරටත් වැඩි දියුණු කිරීමට හැකි විය. තවද, විවට වෙළඳපොළ වෙන්දේසි මගින් වෙළඳපොළ වෙත සංඥාවක් සැපයීම ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව, මුදල් වෙළඳපොළ තුළ විවට වෙළඳපොළ වෙන්දේසි කටයුතු සඳහා බැංකු නොවන ප්‍රාථමික වෙළඳුන් සහභාගී වීම සීමා කරමින් ප්‍රතිපත්ති තීරණයක් ගනු ලැබීය. බැංකු නොවන ප්‍රාථමික වෙළඳුන් හට නිත්‍ය පහසුකම සඳහා සහ එක්දින ද්‍රවශීලතා පහසුකම සඳහා තවදුරටත් සහභාගීවීමට අවස්ථාව සලසන ලදී. මේ අතර, එක්දින පොලී අනුපාතිකවල විචලනය අවම කිරීමේ අරමුණ ඇතිව, මෑතකාලීනව ප්‍රතිපත්ති පොලී අනුපාතික වෙනස් කරන ලද අවස්ථාවේ දී, ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝව පදනම් අංක 100 දක්වා පටු කරන ලදී.

ඉදිරි කාලය තුළදී දැනට පවතින පොලී අනුපාතික කොරිඩෝව වෙනුවට, පොලී අනුපාතික සඳහා පැහැදිලි මඟපෙන්වීමක් ලබාදෙන, ඒක්ෂණ මුදල් වෙළඳපොළ පොලී අනුපාතිකයෙහි උච්චාවචන අඩු කිරීමට සහ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියෙහි විනිවිදභාවය වැඩිදියුණු කෙරෙන තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා පවතින හැකියාව සොයා බැලීමේ ක්‍රියාවලියක අපි මේ වන විට නිරතව සිටිමු. තවද, මුදල් වෙළඳපොළ කටයුතු සුමටව පවත්වාගෙන යෑම සහතික කිරීම සඳහා, සුරැකුම්පත් මිලකරණයට අදාළ ප්‍රතිපත්තිය, අවදානම් අඩු සහ ඉහළ ප්‍රතිලාභ හිමිවන පරිදි ජාත්‍යන්තර මනා පරිචයන් ඇසුරින් සමාලෝචනය කෙරෙනු ඇත. පොලී අනුපාතික හුවමාරු ගිවිසුම් (Interest Rate Swaps/IRS) සහ ගිවිසුම් පරිණත වන දිනයේදී, එකඟ වූ මිල සහ පරිණත වන දිනයේදී අදාළ වන එතැන් මිල අතර වෙනස ගෙවනු ලබන ඉදිරි ගිවිසුම් (Non Deliverable Forwards/NDF) වැනි නව උපකරණ හඳුන්වා දීම හරහා මුදල් වෙළඳපොළ කටයුතු පුළුල් කිරීම පිළිබඳ අපි සලකා බලන්නෙමු.

බැංකු අංශයෙහි තරඟකාරීත්වය වැඩිදියුණු කිරීම සඳහා, වඩාත් හොඳින් පිරිවැය පිළිබිඹු වන විකල්ප පදනම් පොලී අනුපාතිකයක් හඳුන්වා දීම සඳහා මහ බැංකුව විසින් අපේක්ෂිත අතර, එම පොලී අනුපාතිකය බැංකුවල ආන්තික පිරිවැය මත පදනම් වනු ඇත.

විනිමය අනුපාතිකය, මුදල් ප්‍රතිපත්තිය තුළ අරමුණක් ලෙස අප විසින් නොසැලකුවද, උද්ධමන ඉලක්කකරණ රාමුවට සහාය වන ප්‍රධාන උපකරණයක් ලෙස **වෙළඳපොළ මත පදනම් වූ විනිමය අනුපාතිකය** යොදා ගැනේ. මේ අනුව, අපේක්ෂිත නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව තුළ කම්පන බලපෑම් අවශෝෂණය කෙරෙන විචල්‍යයක් ලෙස ක්‍රියාත්මක වීමට විනිමය අනුපාතිකයට ඉඩ හරිමින්, වෙළඳපොළ මත වඩාත් පදනම් වූ විනිමය අනුපාතිකයක් තවදුරටත් පවත්වාගෙන යෑමට මහ බැංකුව කටයුතු කරයි. විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම මගින් සමස්ත උද්ධමන අනුපාතිකය මත ඇති කරනු ලබන බලපෑම කෙරෙහි ගුණාත්මක වෙනසක් නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව මගින් ගෙන එනු ඇත. ඉදිරිගාමී හා පූර්වෝපායික මුදල් ප්‍රතිපත්ති සැලසුම් තුළ, පොලී අනුපාතික වෙනස් කිරීම් හරහා සමස්ත ඉල්ලුම කළමනාකරණය කිරීම තුළින්, විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම තුළින් උද්ධමනය මත ඇතිවන පිරිවැයෙන් තල්ලු වූ පීඩනය අවම කරගත හැකිවන අතර, එමගින් උද්ධමනය ඉලක්කගත පරාසය තුළ පවත්වා ගැනීම තහවුරු කළ හැකිය.

මෙම පදනම අනුව, 2015 සැප්තැම්බර් මාසයේ සිට විනිමය අනුපාතිකය වඩාත් නම්‍යශීලීව තීරණය වීමට මහ බැංකුව විසින් ඉඩ සලසන ලදී. කෙසේ වෙතත්, ගෝලීය වෙළඳපොළ තත්ත්ව, විශේෂයෙන්ම ප්‍රාග්ධනය පිටතට ගලායෑම්, ජංගම ගිණුම මත පැවති පීඩනය ඉහළ යෑම මෙන්ම, වෙළඳපොළ සමපේක්ෂණය ඉහළ යෑම මධ්‍යයේ 2018 වසර තුළදී විනිමය අනුපාතිකයෙහි ඉහළ අවප්‍රමාණයක් දක්නට ලැබිණි. මෙවැනි කාලවකවානු තුළදී, වෙළඳපොළ තුළ ක්‍රමවත් හැඩගැසීමක් අප විසින් සහතික කිරීම අවශ්‍ය වේ. එම නිසා විදේශ සංචිත මත වැඩි බලපෑමක් ඇති නොවන පරිදි විචක්ෂණශීලී ලෙස වෙළඳපොළ තුළ මැදිහත්වීමට මහ බැංකුවට සිදු විය. ඉදිරියේදී, විදේශ විනිමය වෙළඳපොළ තුළ තියුණු විචලතාවක් පවතින අවස්ථාවලදී මහ බැංකුවේ මැදිහත්වීම් සහිත පරික්ෂාකාරී විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් අඛණ්ඩව ක්‍රියාත්මක කෙරෙනු ඇත. තරගකාරී විනිමය අනුපාතිකයක් පවත්වාගෙන යෑම සහ ජංගම ගිණුම ප්‍රතිතුලනය කිරීම සඳහා සහාය වන පරිදි මෙම ප්‍රතිපත්තිය සැලසුම් කර ඇති අතර, එමගින් බාහිර ආරක්ෂණයක් ලෙස විදේශ විනිමය සංචිත ක්‍රමානුකූලව ගොඩනැගීම සඳහා සහාය සැලසෙනු ඇත.

ඉහළ යන ජාත්‍යන්තර පොලී අනුපාතික හමුවේ විදේශ ප්‍රාග්ධනය පිටතට ගලායෑම් හේතුවෙන්, සංචිත ශක්තිමත් කරන අතරතුර, මූල්‍ය ප්‍රවාහ මගින් ජංගම ගිණුමේ හිඟය මූල්‍යනය කිරීම අභියෝගාත්මක කාර්යයක් වනු ඇත. ජංගම ගිණුමේ තිරසාර ශේෂයක් ඇතිකර නොගෙන සහ දිගුකාලීන සහ ණය නොවන මූල්‍ය ප්‍රවාහ වන විදේශ සෘජු ආයෝජන ආකර්ෂණය කර නොගතහොත්, විදේශීය අංශය මැදිකාලීනව මෙන්ම, දිගුකාලීනව ද අවදානම් සහගත තත්ත්වයකට මුහුණ දෙනු ඇත. එමනිසා, අපනයන සහ විදේශ සෘජු ආයෝජන ශීඝ්‍රයෙන් වර්ධනය කර ගැනීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ ප්‍රමුඛතාව හිමි විය යුතු අතර, එසේ නොවුණහොත් විදේශීය අංශය කෙටිකාලීන දේශීය මෙන්ම බාහිර කම්පනයන්ට නිරාවරණය වනු ඇත. ජංගම ගිණුම ක්‍රමානුකූලව ප්‍රතිතුලනය කිරීම සහ ශක්තිමත් මූල්‍ය ගිණුමක් පවත්වා ගැනීම සඳහා, සේවා අංශයේ ඉහළ ඉපැයීම්වල සහාය සහිතව සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම්වල අඛණ්ඩ දායකත්වයද ඇතිව, එක්සත් ජනපද ඩොලර් බිලියන 2 – 3 අතර ප්‍රමාණයක වාර්ෂික සෘජු විදේශ ආයෝජන සමඟ අවම වශයෙන් සියයට 10 ක පමණ අපනයන වර්ධනයක් සමගින් සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගැනීමට අත්‍යවශ්‍ය වේ. එමනිසා, කෙටිකාලීන අවදානම් සහගත තත්ත්ව දිගුකාලීන ව්‍යූහාත්මක ගැටලු බවට පත්වීම වළක්වාලීම සඳහා ආයෝජකයන්ගේ විශ්වාසය ඉහළ නැංවීමට අවශ්‍ය කරනු ලබන තිරසාර ක්‍රියාමාර්ග ගැනීම අත්‍යවශ්‍ය වේ.

මහ බැංකුවේ විදේශ සංචිත කළමනාකරණ කටයුතු, ලෝක බැංකුවේ සංචිත උපදේශන හා කළමනාකරණ වැඩසටහනෙහි සහාය ඇතිව සංවර්ධනය කරන ලද උපායමාර්ගික වත්කම් වෙන් කිරීමේ (Strategic Asset Allocation) රාමුව මත තවදුරටත් පදනම් වනු ඇත. මෙම ක්‍රමවේදය තුළින් ප්‍රමාණවත් ද්‍රවශීලතා මට්ටමක් තහවුරු කිරීමේ සහ සාධාරණ ප්‍රතිලාභ අනුපාතිකයක් ලබාගැනීමේ අරමුණ ඇතිව විදේශ සංචිත කළමනාකරණය කිරීම අපේක්ෂා කරන අතර, වෙළඳපොළ තත්ත්ව යහපත් වන අවස්ථාවල අතිරික්ත ප්‍රතිලාභ ජනනය කිරීමේ අරමුණ ඇතිව ඒ සඳහා පවතින සක්‍රීය උපායමාර්ග සොයා බැලීමද සිදු කෙරේ. තවද, විදේශ ආයෝජකයන් ඇතුළු සියලු පාර්ශ්වකරුවන්ට ප්‍රතිලාභ සැලසෙන පරිදි, පදනම් අනුපාතිකයක් ලෙස ප්‍රධාන විකල්ප ඩොලර්/රුපියල් අනුපාතිකයක් හඳුන්වා දීමේ ක්‍රියාවලියක මහ බැංකුව නිරත වේ.

ඔබ දැනටමත් දන්නා පරිදි, ගෙවුම් ශේෂ දුෂ්කරතා හේතුවෙන් සහ රජයේ ප්‍රතිසංස්කරණ වැඩසටහනට සහාය සැපයීම සඳහා 2015 වසර තුළදී ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙතින් වසර තුනක විස්තීර්ණ ණය පහසුකමක් ලබාගනු ලැබූ අතර, දැනටමත් එයින් ණය වාරික පහක් අප වෙත ලැබී ඇත. පසුගිය සති කිහිපයක කාලය තුළ පැවති තත්ත්වය හේතුවෙන්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි මෙම ණය වැඩසටහන යටතේ ශ්‍රී ලංකාව අත්කර ගනිමින් පැවති ප්‍රගතියෙහි යම් ප්‍රමාදවීමක් සිදු වුවද, මෙම වසර තුළදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි මෙම වැඩසටහන සාර්ථකව පවත්වාගෙන යෑමට අපි අපේක්ෂා කරමු. මෙම වැඩසටහන තුළින් නියත වශයෙන්ම රටේ විදේශ අංශයට සහායක් සැපයෙන අතරම, ආර්ථිකයේ ඵලදායීතාව සහ ආයෝජන විශ්වාසය වර්ධනය කිරීමට උපකාරී වනු ඇත. එම සාධක ආර්ථික වර්ධනය ඉහළ නැංවීම සඳහා හේතුවන ප්‍රධාන සාධක වේ.
උද්ධමන ඉලක්කකරණය මගින් උද්ධමන අපේක්ෂා පාලනය හා කළමනාකරණය කිරීම සඳහා අවධානය යොමුවන හෙයින්, මුදල් ප්‍රතිපත්තියෙහි විනිවිදභාවය, විශේෂයෙන්ම සැලසුම්, අරමුණු සහ තීරණවල විනිවිදභාවයට ඉතා ඉහළ වැදගත්කමක් හිමිවේ. මුදල් ප්‍රතිපත්තියෙහි විනිවිදභාවය සඵලදායි සන්නිවේදනය තුළින් ළඟා කරගත යුතු වන හෙයින්, අනාගතයේදී උද්ධමන ඉලක්කකරණයට යොමුවන රටක් ලෙස, මනාව වැඩිදියුණු කරන ලද සන්නිවේදන උපායමාර්ගයක අවශ්‍යතාව පිළිබඳ මහ බැංකුව ඉහළ අවධානයක් යොමු කරයි.

ඒ අනුව, සන්නිවේදන උපායමාර්ගය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගණනාවක් මේ වන විටත් අප විසින් ක්‍රියාවට නංවා ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි සහාය ඇතිව, මුදල්

ප්‍රතිපත්ති පුවත්පත් නිවේදනවල පැහැදිලි හා සරල බව පවත්වාගෙන යන අතර, ඉදිරි දැක්මකින් යුතුව එහි විශ්ලේෂණාත්මක අගය වැඩිදියුණු කිරීමට අප කටයුතු කර ඇත. මීට අමතරව, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය පිළිබඳ, විශේෂයෙන්ම මාධ්‍යවේදීන් ඇතුළුව අනෙකුත් පාර්ශ්වකරුවන් දැනුම්වත් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මත කරන ලදී. එමෙන්ම, ඉදිරියේදී ක්‍රියාත්මක කිරීම සඳහා අපේක්ෂිත ක්‍රියාමාර්ග කිහිපයක් පවතී. ඒ යටතේ මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශනය නිකුත් කිරීම සහ එය ඉදිරියේදී උද්ධමන වාර්තාවක් (Inflation Report) බවට වැඩිදියුණු කිරීමට අපේක්ෂිත අතර, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය සඳහා වූ පෙර දැක්මෙහි සඳහන් පරිදි, මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් මීළඟ වසර දෙක තුළදී තවදුරටත් ව්‍යාප්ත කෙරෙනු ඇත.

පසුගිය වසරේදී තවත් වැදගත් පියවරක් ලෙස මුදල් ප්‍රතිපත්ති නිවේදන සඳහා මුදල් ප්‍රතිපත්ති දැනුම්දීමේ පූර්ව දින දර්ශනයක් නැවත හඳුන්වා දීමට අපි කටයුතු කළෙමු. එම ක්‍රියාමාර්ගය අඛණ්ඩව පවත්වා ගනිමින්, 2019 වසර තුළ **මුදල් ප්‍රතිපත්ති තීරණ නිවේදනය කරනු ලබන දින දර්ශනය** පහත පරිදි වේ.

**2019 වසරේ මුදල් ප්‍රතිපත්ති නිවේදන**

| නිවේදන අංකය | නිවේදන දිනය |
|---|---|
| 1 | පෙබරවාරි 22, සිකුරාදා |
| 2 | අප්‍රේල් 10, බදාදා |
| 3 | මැයි 31, සිකුරාදා |
| 4 | ජූලි 12, සිකුරාදා |
| 5 | අගෝස්තු 23, බ්‍රහස්පතින්දා |
| 6 | ඔක්තෝබර් 11, සිකුරාදා |
| 7 | නොවැම්බර් 15, සිකුරාදා |
| 8 | දෙසැම්බර් 27, සිකුරාදා |

2018 වසරේ පළමු භාගය තුළ දක්නට ලැබුණ තත්ත්වයට වඩා ගෝලීය ආර්ථිකය වර්තමානයේදී යම් අසතුටුදායක මට්ටමක පැවතියද, ප්‍රධාන රටවල මුදල් ප්‍රතිපත්තිය තවදුරටත් දැඩි කිරීම සඳහා යම් පදනමක් සපයමින්, ගෝලීය ආර්ථික වර්ධන වේගය තවදුරටත් ශක්තිමත්ව පවතී. ප්‍රාග්ධන ගලා යෑම්, විනිමය අනුපාතික අවප්‍රමාණය වීම, වෙළඳ ගැටුම් යනාදිය ආශ්‍රිතව ඇතිවිය හැකි ආර්ථික අසමතුලිතතාවන්ට විසඳුම් සෙවීමේ අරමුණ

ඇතිව නැඟී එන වෙළඳපොළ ආර්ථිකවලට සිය මුදල් ප්‍රතිපත්තිය වෙනස් කිරීම සඳහා මෙම තත්ත්වය බලපෑම් කර ඇත. එවැනි ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් සහ දේශීය ආර්ථිකයේ වර්ධනයන්ට ප්‍රතිචාර දක්වමින්, ශ්‍රී ලංකාවේ ආර්ථික සහ මිල ස්ථායීතාව තිරසාරව පවත්වා ගැනීම තහවුරු කිරීම සඳහා අපගේ මුදල් ප්‍රතිපත්ති සැලසුම් කිරීමේදී අඛණ්ඩව වඩාත් සුපරීක්ෂාකාරීව අපි කටයුතු කරන්නෙමු.

# 3. 2019 වසර සහ ඉදිරිය සඳහා මූල්‍ය අංශ ප්‍රතිපත්ති

සම්පත් කාර්යක්ෂමව බෙදා හැරීම තුළින් ආර්ථික වර්ධනයට පහසුකම් සලසනු ලබන අතර කම්පනවලට ඔරොත්තු දිය හැකි ශක්තිමත් මූල්‍ය අංශයක් ඇති කිරීමට අඛණ්ඩව කටයුතු කිරීම මගින් මුදල් නීති පනතෙහි සඳහන් වගකීම් ඉටු කිරීමේ අරමුණ ඇතිව මහ බැංකුව ක්‍රියා කරයි. මේ සඳහා, මූල්‍ය පද්ධතියේ ප්‍රධාන නියාමන හා අධීක්ෂණ ආයතනය ලෙස මහ බැංකුව ක්‍රියාත්මක වේ. එමඟින්, කාර්යක්ෂම ගෙවීම් හා පියවීම් පද්ධතියක් සඳහා පහසුකම් සලසන අතරම, වෙනස්වන තත්ත්වයන් හා ගැළපෙන හා ස්ථාවර මූල්‍ය ආයතන ක්‍රියාත්මක වීම ප්‍රවර්ධනය කරනු ලබයි.

දේශීය මෙන්ම ගෝලීය වාතාවරණය තුළ පැවති අභියෝගාත්මක වෙළඳපොළ තත්ත්ව හමුවේ වුවද, 2018 වසරේදී මූල්‍ය අංශය සතුටුදායී ක්‍රියාකාරිත්වයක් පෙන්වීය. ද්‍රවශීලතා හා ප්‍රාග්ධන මට්ටම් වර්ධනය වීමත් සමඟ බැංකු අංශයේ වත්කම් වර්ධනය හිතකර මට්ටමක පැවති අතර, බැංකු නොවන මූල්‍ය අංශයේ මන්දගාමී වීම හමුවේ වුවද 2018 වසරේදී මූල්‍ය අංශයෙහි ව්‍යාප්තියද ශක්තිමත් විය.

බැංකු අංශයෙහි නියාමන සහ අධීක්ෂණ රාමුව ශක්තිමත් කිරීම අපගේ මූල්‍ය අංශ ප්‍රතිපත්තියෙහි ප්‍රධාන අරමුණයි. 2018 වසරේදී, ජාත්‍යන්තර ප්‍රමිතීන් හා මනා පරිචයන්ට අනුව ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග රාශියක් හඳුන්වා දීම හරහා බලපත්‍රලාභී බැංකුවලට අදාළ නියාමන හා අධීක්ෂණ රාමුව තවදුරටත් ශක්තිමත් කරන ලදී. 2018 වසරේදී, මහ බැංකුව බාසල් III ද්‍රවශීලතා ප්‍රමිතීන් සහ තෝලන අනුපාතය (Leverage Ratio) සඳහා වන විධාන නිකුත් කරන ලදී. තෝලන ප්‍රමිතීන් සඳහා වන විධාන ද නිකුත් කෙරෙමින් පවතී. මීට අමතරව, විදේශ ණය ලබා ගැනීමේදී විනිවිදභාවය ඉහළ නැංවීම සහ අවදානම් කළමනාකරණය තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් බලපත්‍රලාභී බැංකු විසින් ලබාගනු ලබන විදේශ විනිමය ණය මත මහ බැංකුව විසින් විධාන නිකුත් කරන ලදී.

මේ අතර, අවදානම් කළමනාකරණය ශක්තිමත් කිරීම සඳහා බලපත්‍රලාභී බැංකුවල මූල්‍ය ව්‍යුත්පන්න ගනුදෙනු සඳහා මහ බැංකුව විසින් විධාන නිකුත් කෙරිණ. නියෝජිතයන් පත් කිරීම සඳහා නියාමන රාමුවක්ද ස්ථාපනය කෙරිණ. මෙම විධානය මගින් නියෝජිතයන් සඳහා වන අනුමැතිය හා තෝරා ගැනීමේ ක්‍රියාවලිය, බැංකුවල වගකීම්, අවසරලත්

ක්‍රියාකාරකම්, අවදානම් කළමනාකරණය හා අධීක්ෂණය, පාරිභෝගික ආරක්ෂාව සහ ගැටලු නිරාකරණය යන අංශ සඳහා ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරනු ලබයි. තවද, මූල්‍ය උපකරණ පිළිබඳ මූල්‍ය වාර්තාකරණය සඳහා වන 9 වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (Sri Lanka Financial Reporting Standards 9) වෙත යොමු වීමද ජාත්‍යන්තර මනා පරිචයන් හා අනුකූලව ගනු ලැබූ තවත් ඉදිරි ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයකි. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේද අදහස් සලකා බලා 9 වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති වෙත යොමු වීමේදී, ගැළපෙන හා විචක්ෂණ ලෙස එම ප්‍රමිතීන් යොදා ගැනීමට බැංකු සඳහා වන මාර්ගෝපදේශ මහ බැංකුව විසින් නිකුත් කරන ලදී.

බලපත්‍රලාභී බැංකු සඳහා වන නියාමන රාමුව තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණු ඇතිව මහ බැංකුව විසින් නව බැංකු පනතක් කෙටුම්පත් කිරීමේ  කටයුතු දැනටමත් ආරම්භ කර ඇත. මෙම යෝජිත පනත සඳහා අධීක්ෂණය හා නියාමනය සඳහා වන සමස්ත බලතල, ආයතනික යහපාලනය ශක්තිමත් කිරීම, ඩිජිටල් බැංකුකරණය, ඒකාබද්ධ අධීක්ෂණය, ගැටලු නිරාකරණය, දඩ මුදල්/දඬුවම්, සීමා පැනවීම්, එකතු වීම්, ආයතන අත්කර ගැනීම් හා ඒකාබද්ධ කිරීම්, විදේශ බැංකු අනුබද්ධ කිරීම් සහ විවිධ ස්ථරවලින් යුත් බැංකු ව්‍යුහය සඳහා විවිධ නියාමන රාමු හඳුන්වා දීම යන ප්‍රධාන ප්‍රතිපත්තිමය කරුණු ඇතුළත් කිරීමට නියමිතය. මීට අමතරව, අවදානම් මත පදනම් වූ අධීක්ෂණය සහ අධීක්ෂණ දින දර්ශනය සැලසුම් කිරීම සඳහා බැංකු කටයුතුවල තිරසාර බව ශ්‍රේණිගත කිරීමේ දර්ශකය (Banking Sustainability Rating Index/BSRI) 2019 වසරේ සිට ක්‍රියාත්මක කිරීමට නියමිතය.

සයිබර් ප්‍රහාර හා අනෙකුත් තොරතුරු ආරක්ෂණ තර්ජන සඳහා බැංකු නිරන්තරයෙන් ඉලක්ක වීම හේතුවෙන් ජාත්‍යන්තර ප්‍රමිති හා මනා පරිචයන්ට අනුගතව බැංකු අංශයේ තාක්ෂණික අවදානම්වලට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා වන පෙර දැක්මක් සහ සාකච්ඡා පත්‍රිකාවක් නිකුත් කෙරිණ. මීට අදාළව බැංකු විධානයක් 2019 වසරේදී නිකුත් කිරීමට නියමිතය.

නියාමන ආයතනය ලෙස, ආයතනික යහපාලනය ශක්තිමත් කිරීමට සහ හිමිකාරිත්වය සංකේන්ද්‍රණය, මණ්ඩලවල අධිකාරිත්වය, අදාළ පාර්ශ්ව සමඟ සිදුවන ගනුදෙනු ආශ්‍රිත අවදානම් හා බැඳියාවන් පිළිබඳ ගැටුම් වළක්වා ගැනීම ආදිය සඳහා බැංකුවල හිමිකාරිත්ව කොටස් පුළුල් කිරීමට අවශ්‍ය බව අපි විශ්වාස කරන්නෙමු. එම නිසා, කොටස් හිමිකම් පිළිබඳ

දැනට පවත්නා අවශ්‍යතා සමාලෝචනය කරනු ඇති අතර, ඇතැම් අමතර ක්‍රියාමාර්ග ගනු ලබනු ඇත. මීට අමතරව, බැංකුවල ප්‍රධාන තනතුරු සඳහා වඩා යෝග්‍ය හා සුදුසුකම්ලත් පුද්ගලයන් පත් කිරීම සඳහා බැංකු අධ්‍යක්ෂකවරුන්, ප්‍රධාන විධායක නිලධාරීන් හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් පත් කිරීම සඳහා යෝග්‍ය හා නිසි ඇගයුම් ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කෙරෙනු ඇත. යහපත් ආචාර ධර්ම හා මූල්‍ය අවංකභාවය තහවුරු කළ පුද්ගලයන් පමණක් මෙවැනි පත්වීම් සඳහා සලකා බලනු ලැබේ.

තවද, බාහිර විශේෂඥ දායකත්වය ලබාගැනීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින් විදේශිකයන්ගේ සේවාව ලබා ගැනීම සඳහා පුළුල් ප්‍රතිපත්ති හඳුන්වා දෙනු ඇත. බැංකු කටයුතුවල සහ වෘත්තීය ගිණුම්කරණ/විගණන ක්ෂේත්‍රයේ සැලකිය යුතු වර්ධනය සැලකිල්ලට ගනිමින් බාහිර විගණන නිලධාරීන් පත් කිරීමේ අවම නිර්ණායක දැනටමත් සමාලෝචනය කර ඇති අතර, සුදුසුකම්ලත් විගණන නිලධාරි මණ්ඩලය ඒ අනුව සංශෝධනය කෙරෙනු ඇත.

බලපත්‍රලාභී බැංකුවල භාණ්ඩාගාර මෙහෙයුම් සඳහා වන වෙළඳපොළ ක්‍රියාකාරකම් සහ පරිචයන් තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව බලපත්‍රලාභී බැංකුවල භාණ්ඩාගාර මෙහෙයුම් විචක්ෂණශීලී ලෙස සහ ජාත්‍යන්තර මනා පරිචයන්ට අනුව සිදු කෙරෙන බවට තහවුරු කිරීම සඳහා නව නියාමන රාමුවක් හඳුන්වා දීමට මහ බැංකුව අපේක්ෂා කරයි. ගැටලුකාරී බැංකුවලට වන අහිතකර බලපෑම සහ එමඟින් අනෙකුත් අංශවලට සිදුවන බලපෑම අවම කිරීම සඳහා මහ බැංකුව විසින් බැංකු අංශය සඳහා අර්බුදවලට සූදානම් වීමේ සැලසුමක්ද සම්පාදනය කරනු ඇත. මේ සම්බන්ධයෙන් බැංකු සඳහා වන සාකච්ඡා පත්‍රිකාවක් ඉදිරියේදී නිකුත් කෙරෙනු ඇත.

නියාමන අධිකාරීන් අතර අන්තර් සහයෝගීතාව ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව අප දැඩි ලෙස විශ්වාස කරන බැවින්, අවදානම් පදනම් කරගත් ඒකාබද්ධ සුපරීක්ෂණය පිළිබඳව අවබෝධතා ගිවිසුම් මහ බැංකුව, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සහ රක්ෂණ නියාමන කොමිසම අතර අත්සන් කරනු ලැබූ අතර, මහ බැංකුව ප්‍රධාන නියාමක ලෙස කටයුතු කරයි.

බොහෝ අවස්ථාවලදී අප අවධාරණය කොට ඇති පරිදි, මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ආරක්ෂා කර ගනිමින් ආර්ථිකයේ මූල්‍ය අවශ්‍යතා ඵලදායී ලෙස සපුරා ගැනීම සඳහා ශක්තිමත් සහ ගතික බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතන ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් වෙළඳපොළ පදනම් කරගත් ඒකාබද්ධකරණ වැඩ පිළිවෙළක් සඳහා අප විසින් පහසුකම් සලසනු ඇත.

ණය වර්ධනය අඩුවීම, ලාභදායිත්වය අඩුවීම සහ අක්‍රිය ණය වැඩි වීම හේතුවෙන් 2018 වසරේදී බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යාකරණ සමාගම්වල ක්‍රියාකාරිත්වය සැලකිය යුතු ලෙස අඩු විය. මෙම අංශයෙහි මන්දගාමී ක්‍රියාකාරිත්වය සඳහා අඩු ආර්ථික වර්ධනය සහ 2017 වසරේ දී සහ 2018 වසරේ පළමු භාගයේ දී පැවති ගංවතුර සහ නියං තත්ත්ව වැනි ස්වාභාවික විපත්ද බලපෑවේය. මෝටර් රථ වාහන ආනයනය සඳහා පැවති අධික ඉල්ලුම පාලනය කිරීම සඳහා අනුගමනය කරන ලද ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ද මෙම අංශයේ ක්‍රියාකාරිත්වය සඳහා සැලකිය යුතු ලෙස බලපෑවේය.

2018 වසරේදී බැංකු නොවන මූල්‍ය ආයතන ශක්තිමත් කිරීම සඳහා නියාමන පියවර කිහිපයක් හඳුන්වා දෙන ලදී. පාරිභෝගික අවශ්‍යතා සුරක්ෂිත කිරීම සහ මෙම අංශය පිළිබඳ පාරිභෝගික විශ්වාසය ශක්තිමත් කිරීම සඳහා මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුවක් හඳුන්වා දෙන ලදී.

අවදානම් කළමනාකරණය පිළිබඳ දැඩිව අවධාරණය කිරීමට සහ එම අංශයෙහි දැනට සිදුවෙමින් පවතින අවදානම් තක්සේරු කිරීමේ හැකියාවන් වර්ධනය කිරීම දිරි ගැන්වීමේ අරමුණ ඇතිව බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යාකරණ සමාගම් සඳහා නව ප්‍රාග්ධන ප්‍රමාණාත්මක රාමුවක් ක්‍රියාත්මක කරන ලදී. මෙම නව රාමුව තුළ රුපියල් බිලියන 100 ට වඩා වැඩි වත්කම් සහිත සමාගම් සඳහා ඉහළ ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාත පවත්වා ගැනීම අවශ්‍ය වේ.

තවද, ව්‍යාපාර බාහිර පාර්ශ්ව වෙත පැවරීම ප්‍රමිතිගත කිරීම සඳහා ව්‍යාපාර ක්‍රියාවලි බාහිර පාර්ශ්ව වෙත පැවරීම සඳහා වන නව විධිවිධාන හඳුන්වා දෙන ලදී. බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යාකරණ සමාගම්වල නිශ්චල දේපළ සම්බන්ධයෙන් තක්සේරු කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා විධාන නිකුත් කරන ලදී. තැන්පත්කරුවන්ගේ අභිවෘද්ධිය සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සැලකිල්ලට ගනිමින් 2018 වසරේදී ඇතැම්

බලපත්‍ර අවලංගු කිරීම සහ බලපත්‍රලාභී මුදල් සමාගම් ඇවර කිරීම සඳහා නියාමන හඳුන්වා දීම ඇතුළු නිරාකරණ ක්‍රියාමාර්ග කිහිපයක් ගැටලුකාරී සමාගම් සම්බන්ධයෙන් ක්‍රියාවට නංවන ලදී.

ඉදිරියේදී හඳුන්වාදීමට නියමිත 9 වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අදාළව අවම ප්‍රාග්ධන අවශ්‍යතාව ඉහළ නැංවීම සහ ඉහළ ණය හානි වෙන් කිරීම යනාදිය සමඟ අනුගත වීමට මෙම අංශයට සිදුවනු ඇත. තවද, මහ බැංකුවේ නියාමන ප්‍රවේශය වෙනස්වීම හේතුවෙන්, අනුකූල නොවන, අර්බුදයට ලක්වූ සහ ඉහළ අවදානමක් සහිත බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා පූර්ව මැදිහත්වීම් සිදුවිය හැකිය. මේ යටතට, තැන්පතු සහ ණය සීමා මෙන්ම, බලපත්‍ර අත්හිටුවීම් හා අවලංගු කිරීම් යනාදිය තුළින් ව්‍යාපාර කටයුතු සීමා කිරීම වැනි නියාමන ක්‍රියාමාර්ග ඇතුළත් විය හැකිය. තවද, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල මූල්‍ය වාර්තාකරණයට අදාළ මාර්ගෝපදේශ ප්‍රකාශයට පත් කිරීමට අපේක්ෂිතය.  හිමිකම් සීමා සඳහා ද විධාන නිකුත් කිරීමට අපි සලකා බලන්නෙමු.

එමෙන්ම, ප්‍රාග්ධන අවශ්‍යතා ඉහළ නැංවීම හේතුවෙන් මෙම අංශයෙහි ප්‍රාග්ධන මට්ටම් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂිතය. එයට අනුකූල නොවන බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් ස්වේච්ඡා පදනම මත ඒකාබද්ධ වීම සඳහා දිරි ගන්වනු ලැබේ. අනුකූල නොවීම හේතුවෙන් තැන්පතු සහ ව්‍යාපාර ප්‍රසාරණය සඳහා සීමා පනවනු ඇති අතර, අවශ්‍ය විටකදී එම ව්‍යාපාර කටයුතු නවතා දැමීමද සිදු කෙරෙනු ඇත. එබැවින්, නුදුරු අනාගතයේදී බලපත්‍රලාභී මුදල් සමාගම් ප්‍රාග්ධන වර්ධන සැලසුම් සඳහා වැඩි ප්‍රමුඛතාවක් ලබාදීම අවශ්‍ය වනු ඇත. මේ සම්බන්ධයෙන් කිසිදු නියාමන දුර්වලතාවයක් හෝ අවහිරතාවක් නොපවතිනු ඇත.

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතට අදාළ විධිවිධාන ප්‍රකාරව දැනට නොවිසඳී ඇති අර්බුදයට ලක්වූ සමාගම්වල ගැටලු විසඳීම සඳහා අප විසින් ක්‍රියාමාර්ග ගනිමින් පවතී. අර්බුදයට ලක් වූ සමාගම් දෙකක බලපත්‍ර අවලංගු කර ඇති අතර, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ තැන්පත්කරුවන්ගේ වගකීම් නිරවුල් කිරීම මේ වන විට සිදුවෙමින් පවතී. අර්බුදයට ලක්වූ මුදල් සමාගම්වල ගැටලු කඩිනමින් නිරාකරණය කිරීම පහසු කිරීම සඳහා මුදල් ව්‍යාපාර පනත සඳහා සංශෝධන යෝජනා කරනු ලැබ ඇත.

2018 වසර තුළදී, ආර්ථිකයෙහි වර්ධනය වන ගෙවීම් අවශ්‍යතා සඳහා සරිලන අයුරින් කාර්යක්ෂම ජාතික ගෙවීම් සහ පියවීම් පද්ධතියක් ස්ථාපනය කරමින් **ගෙවීම් සහ පියවීම් යටිතල පහසුකම්** ශක්තිමත් කිරීමට මහ බැංකුව අඛණ්ඩව පියවර ගෙන ඇත.

අප විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග කිහිපයක් මෙහිදී සඳහන් කිරීමට කැමැත්තෙමි. ජාත්‍යන්තර ගෙවීම් කාඩ්පත් ක්‍රමවේදයක් සමඟ හවුල්කාරීත්වය යටතේ "LankaPay" නමින් ජාතික ගෙවීම් කාඩ්පත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට ලංකා ක්ලියර් පෞද්ගලික සමාගමට අවසර ලබා දෙන ලදී. මෙම පද්ධතිය 2018 වසරේදී දියත් කරන ලද අතර, එක් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් මෙම "LankaPay" කාඩ්පත් නිකුත් කිරීම ආරම්භ කළේය.

ලොව පුරා නව ගෙවීම් තාක්ෂණ ප්‍රවණතා ඇතිවීම සහ එබඳු තාක්ෂණය සමඟ යාවත්කාලීන වීමට දේශීය ආයතනවල ඇති උනන්දුවෙහි ප්‍රතිඵලයක් ලෙස ගෙවීම් සහ පියවීම් පද්ධතිවලට අදාළ උපදේශන කමිටුව වන ජාතික ගෙවීම් කවුන්සිලය විසින් මූල්‍ය තාක්ෂණය (FinTech) හා බ්ලොක්චේන් (Blockchain) තාක්ෂණයට අදාළ වර්ධනයන් පිළිබඳ අධ්‍යයනය කිරීමට කමිටු දෙකක් පත් කරන ලදී. මූල්‍ය තාක්ෂණ කමිටුවේ නිර්දේශවලට අනුව, QR කේත පදනම් කරගත් ගෙවීම් සඳහා පහසුකම් සැපයීමට සියලුම මූල්‍ය ආයතන සහ ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් පද්ධති සඳහා "LANKAQR" නමින් දේශීය ව්‍යවහාර මුදලින් සිදු කරන ගෙවීම් වෙනුවෙන් ජාතික QR කේත ප්‍රමිතිය හඳුන්වා දෙන ලදී. එසේම, බ්ලොක්චේන් තාක්ෂණයට අදාළව, අන්තර් ක්ෂේත්‍ර ක්‍රියාකාරී කමිටුව විසින් බ්ලොක්චේන් තාක්ෂණය මත පදනම් වූ ගනුදෙනුකරුවන් හඳුනා ගැනීම සඳහා තොරතුරු හුවමාරු කර ගැනීමේ විසඳුමක් සකස් කෙරෙමින් පවතී.

තවද, මූල්‍ය පද්ධති ස්ථායීතාව සහ මහජන අරමුදල්වල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා හඳුන්වා දීමට අවශ්‍ය වන නියාමන පියවර පිළිබඳ විමර්ශනය කිරීම සඳහා අතථ්‍ය මුදල් (Virtual Currency) ක්‍රම පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා කාර්යසාධක බලකායක් මහ බැංකුව විසින් පත් කර ඇත. මෙයට අමතරව, රටේ ගෙවීම් සහ පියවීම් පද්ධතියෙහි කාර්යක්ෂමතාව සහ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා 2018 වසරේදී නියාමන කිහිපයක්ද නිකුත් කොට ඇත.

අනාගත සැලසුම් සහ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ගත් විට, ශ්‍රී ලංකා මහ බැංකුව, ව්‍යවහාර මුදල් කළමනාකරණයෙහි පිරිවැය අඩු කරමින් සහ ආරක්ෂාව හා පහසුව ඉහළ නැංවීමේ අරමුණ සහිතව මුදල් අවම වශයෙන් භාවිතා කරන සමාජයක් ඇති කිරීමට ඩිජිටල් ගෙවුම් යාන්ත්‍රණ ප්‍රවර්ධනය කිරීමට අවධානය යොමු කරනු ඇත. ඒ අනුව, බස් රථ සහ දුම්රියේ ගමන්වල දී භාවිතයට ගැනීම සඳහා ජාතික වශයෙන් පිළිගත් ගෙවීම් කාඩ්පතක් හඳුන්වා දීම සඳහා ජාතික ගෙවීම් කාඩ්පතක් සහ ප්‍රවේශ පත්‍ර හා ගමන් ගාස්තු රැස් කිරීම සඳහා වන යටිතල පහසුකම් රාමුවක් හඳුන්වා දීමට අපි පහසුකම් සලසන්නෙමු. ඩිජිටල් ගෙවීම් ක්‍රමවේද ඇති කිරීමට මූල්‍ය ආයතන ධෛර්යවත් කිරීම සහ ඩිජිටල් ගෙවීම් විකල්ප හා ඒවායේ වාසි පිළිබඳ මහජනතාව දැනුම්වත් කිරීම මගින් ඩිජිටල් ගෙවීම් යාන්ත්‍රණ ප්‍රවර්ධනය කිරීම සඳහා තවදුරටත් ක්‍රියාමාර්ග ගනු ලබනු ඇත.

නියාමන අවශ්‍යතාවලට අනුකූල වෙමින් නව මූල්‍ය තාක්ෂණ නිෂ්පාදන හඳුන්වා දීම සඳහා නියාමන පරීක්ෂණ අවකාශයක් (Regulatory Sand Box) පිහිටුවීම සඳහාද සැලසුම් සකස් කොට ඇත.

මෙම ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග තුළින් අතථ්‍ය බැංකුකරණයට යොමුවීමට සහ දියුණු තාක්ෂණයෙන් ප්‍රතිලාභ ලැබීම සඳහා ශ්‍රී ලංකාවට අවශ්‍ය පරිසරය නිර්මාණය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. එමෙන්ම, මෙම තාක්ෂණ ප්‍රවණතා සමඟ නොපමාව සම්බන්ධ වීමට අපි මූල්‍ය ආයතන වෙත ආරාධනා කරන්නෙමු.

ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය, මින් පෙර නොවූ විරූ අයුරින් එකිනෙක හා බැඳුණු මෙන්ම, සංකීර්ණ බවට පත් වී ඇති අතර කම්පනවලට වඩාත් විවර වෙමින් පවතියි. ඒ අනුව, තනි ආයතන සුපරීක්ෂණය කිරීම වෙනුවට රටේ සමස්ත මූල්‍ය ස්ථායීතාව වෙත බලපෑම් කළ හැකි වෙළඳපොළ සහ ආර්ථික අංශ වෙත සමස්තයක් ලෙස අවධානය යොමු කිරීමට හැකියාව සහිත පුළුල් **සාර්ව විචක්ෂණ ප්‍රවේශයක** වැදගත්කම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුනා ගෙන ඇත.

පෙර සඳහන් කළ පරිදි, වෙළඳපොළ අභියෝග තත්ත්ව හමුවේ වුවද, සූක්ෂම විචක්ෂණශීලී සුපරීක්ෂණය සහ නියාමනයන්ට අමතරව, නිසිකලට ක්‍රියාත්මක කරන ලද සාර්ව විචක්ෂණශීලී ක්‍රියාමාර්ග හේතුවෙන්, 2018 වසරේදී මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වා ගැනීමට

හැකිවිය. මෙහිදී, මූල්‍ය පද්ධතියෙහි සහ සාර්ව ආර්ථිකයෙහි ස්ථායීතාවට බලපානු ලබන පද්ධතිමය අවදානම් සඳහා මුහුණ දීමට ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය ක්‍රියාමාර්ග ගණනාවක් ගෙන ඇත. මෝටර් රථ වාහන සඳහා ණය ලබාදීමේදී වටිනාකම මත උපරිම ණය අනුපාත පැනවීම සහ තෝරාගත් වාහන කාණ්ඩ හා අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය කිරීමේදී වන ණයවර ලිපි සඳහා සීමා පැනවීම මෙවැනි නැඟී එන අවදානම් පාලනය කිරීම සඳහා මහ බැංකුව විසින් ගන්නා ලද ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අතර වේ. පද්ධතියේ සමස්ත ස්ථායීතාවට බාධාවක් විය හැකි ආර්ථිකයේ අර්බුදකාරී අංශවල ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා මහ බැංකුව තවදුරටත් සාර්ව විචක්ෂණශීලී ක්‍රියාමාර්ග අනුගමනය කරනු ඇත. එමෙන්ම, මහ බැංකු නීති පද්ධතිය සඳහා යෝජිත සංශෝධන අතරට ශක්තිමත් සාර්ව විචක්ෂණශීලී රාමුවක් ඇතුළත් කිරීමට අපි අපේක්ෂා කරන්නෙමු.

මහ බැංකුවේ, සාර්ව විචක්ෂණ ආවේක්ෂණ රාමුව යටතේ නව ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කොට ඇත. මේ අතරට, ආයතනික අංශය වෙත බැංකු සහ බැංකු නොවන අංශ යොමු වීමේ ප්‍රවණතා විශ්ලේෂණය කිරීම, බැංකු අංශයෙහි ගතික වෙන් කිරීමේ රාමුවල බලපෑම තක්සේරු කිරීම, ගෘහස්ථ අංශය වෙත මූල්‍ය අංශයෙහි යොමු වීම විශ්ලේෂණය කිරීම, නිශ්චල දේපොළ වෙළඳාමේ දිගුකාලීන ස්ථායී බව ආරක්ෂා කිරීම සහ නේවාසික ඉඩකඩම් මිලදී ගන්නන් ආරක්ෂා කර ගැනීම සඳහා එස්ක්‍රෝ (Escrow) ගිණුම් හඳුන්වා දීම මෙන්ම, ණය වෙළඳපොළ සහ ද්‍රවශීලතා අවදානම් ආවරණය කිරීම උදෙසා බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා බහු විචල්‍ය කම්පන පරීක්ෂා සිදු කිරීම ආරම්භ කිරීම යනාදිය අයත් වේ.

අවදානම් කළමනාකරණය මහ බැංකුවේ ප්‍රධාන උපායමාර්ගික ප්‍රමුඛතාවක් ලෙස හඳුනාගෙන ඇති අතර, සෑම තරාතිරමක දැනුම්වත් වීමකින් අනතුරුව අවදානම් භාර ගැනීමේ ක්‍රමවේදයක් සකස් කිරීමේ අරමුණින්, **අවදානම් කළමනාකරණය සඳහා අන්තර්ග්‍රාහී ප්‍රවේශයක්** ක්‍රියාවට නැංවීම සඳහා අපි කටයුතු කරමින් සිටිමු. ඒ අනුව, 2018 වසරේදී, මහ බැංකුවේ අවදානම් යහපාලන රාමුව සහ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර, මෙම රාමුව ක්‍රියාවට නැංවීම සඳහා අදාළ කමිටු ස්ථාපිත කිරීම සහ රැස්වීම් පැවැත්වීම සිදු කරන ලදී. 2019 වසරේදී, අවදානම් ලේඛනයක් සකස් කිරීමට සහ සිදුවීම් වාර්තාකරණ යාන්ත්‍රණයක් ක්‍රියාවට නැංවීමට අප අපේක්ෂා කරන්නෙමු. මූල්‍ය අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් ගත් කල, අරමුදල් කළමනාකරණයට අදාළ අවදානම් කළමනාකරණ රාමුව තවදුරටත් ශක්තිමත් කෙරෙනු ඇත.

තිරසාර සංවර්ධන ඉලක්ක සපුරාලීමේ ප්‍රමුඛතාව මෙන්ම, ඵලදායී හා තිරසාර ආයෝජන අවස්ථා තුළින් හරිත හා පරිසර හිතකාමී වර්ධන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව 2017 වසරේදී **තිරසාර මූල්‍ය ක්‍රියාමාර්ග** ප්‍රවර්ධනය කිරීමේ වැඩපිළිවෙළක් ආරම්භ කළේය. ඒ අනුව, මූල්‍ය අංශය සඳහා ප්‍රතිපත්ති විධාන ලබාදීම අරමුණු කොටගෙන මහ බැංකුව විසින් මේ වන විට ශ්‍රී ලංකාවේ තිරසාර මූල්‍ය සඳහා ඉදිරි දැක්මක් පිළියෙල කෙරෙමින් පවතී. මෙම ක්‍රියාවලිය සඳහා, ලෝක බැංකුවෙහි ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව වෙතින් තාක්ෂණික සහාය ද එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩපිළිවෙළ වෙතින් මූල්‍ය සහාය ද අපි ලබා ගන්නෙමු. සියලුම පාර්ශ්වකරුවන්ට ඔවුන්ගේ තිරසාර මූල්‍ය ප්‍රතිපත්ති සඳහා වන මගපෙන්වීමේ "තිරසාර මූල්‍ය සඳහා ඉදිරි දැක්මක්" 2019 වසරේදී මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

# 4. මහ බැංකුවේ නියෝජිත කාර්යයන් සඳහා අදාළ ප්‍රතිපත්ති

මූලික කාර්යභාරයට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුව නියෝජිත කාර්යයන් රැසක් කාර්යක්ෂම ලෙස ඉටු කරනු ලබයි. ආර්ථිකය සහ මූල්‍ය පද්ධතිය සුමට ලෙස ක්‍රියාත්මක වීමට සහාය වෙමින් සහ එමගින් සමස්තයක් වශයෙන් ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා අපි එම කාර්යයන්හි නියැළෙමු.

**ව්‍යවහාර මුදල් කළමනාකරණය**

රජය වෙනුවෙන් ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි නිකුත් කිරීමේ සම්පූර්ණ බලතල මහ බැංකුව සතුය. අප වෙත ලබා දී ඇති බලතල ප්‍රකාරව, 2018 වසර තුළදී මෙම ක්‍රියාවලිය අපි අඛණ්ඩව ඉටු කළෙමු. තාක්ෂණික වශයෙන් දියුණු මුදල් නොවන ගෙවීම් ක්‍රමවේද භාවිතය වැඩිවෙමින් තිබුණද, ආර්ථිකයෙහි ප්‍රසාරණය හමුවේ 2018 වසරේදී මුදල් නෝට්ටු සහ කාසිවලට පැවති ඉල්ලුම ඉහළ ගියේය. 2018 වසරේදී, අප විසින් නව කාසි නිකුතුවක් සිදු කළ අතර, සමරු මුදල් නෝට්ටුවක් සහ සමරු කාසියක් ද නිකුත් කළෙමු. එමෙන්ම, මුදල් නෝට්ටු ආරක්ෂා කිරීමේ අරමුණින් හිතාමතා වෙනස් කළ, හානි කළ හෝ විකෘති කරන ලද මුදල් නෝට්ටු පිළිබඳ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හඳුන්වා දෙන ලදී. එමෙන්ම, පිරිසිදු ව්‍යවහාර මුදල් ප්‍රතිපත්තිය පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් මාලාවක් ද පවත්වන ලදී.

ව්‍යවහාර මුදල් මෙහෙයුම් කටයුතු සහ ක්‍රියාවලිය ඉදිරියේදී වැඩිදියුණු කිරීම සඳහා රාජගිරියේ බැංකු විද්‍යපීඨ ආශ්‍රිතව නව ආරක්ෂිත ගබඩාවක් ඉදිකිරීමේ කටයුතු අරඹා ඇත. 2019 වසරේදී මෙහි මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට නියමිතය. මැදිකාලීන වශයෙන්, මෙහෙයුම් කටයුතුවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට සහ මුදල් නෝට්ටු පිරි සැකසුම් ධාරිතාව ඉහළ නැංවීම සඳහා, නව යන්ත්‍ර සූත්‍ර හා මෘදුකාංග හඳුන්වා දීම තුළින් පවතින මෙහෙයුම් ක්‍රියාවලිය යළි සැලසුම් කිරීමට අපි කටයුතු කරමින් සිටිමු. මුදල් නෝට්ටුවල තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා 2021 වසරේදී නව මුදල් නෝට්ටු මාලාවක් හඳුන්වා දීමට සැලසුම් කරන්නෙමු. කාසි බෙදාහැරීමට සහ කාසි නිකුත් කරන යන්ත්‍ර හඳුන්වා දීමට සුදුසු යාන්ත්‍රණයක් ඇති කිරීමට මේ වන විටත් අප විසින් සැලසුම් කර ඇත. තවදුරටත්, මුදල් ප්‍රවාහනය සිදු කරන සමාගම් සඳහා සවිමත් අධීක්ෂණ පද්ධතියක් හඳුන්වා දෙන අතර, හදිසි අවස්ථාවල දී මුදල් ගබඩා කිරීමට

හැකි වන පරිදි තෝරාගත් ප්‍රාදේශීය කාර්යාලවල විකල්ප ගබඩා පහසුකම්වල ධාරිතාව ඉහළ නැංවීමට අදහස් කර ඇත.

**රාජ්‍ය ණය කළමනාකරණය**

රාජ්‍ය මූල්‍ය නියෝජිත වශයෙන් රාජ්‍ය ණයෙහි තිරසාර බව තහවුරු කරන අතරම, අඩු අවදානම් මට්ටමක් සහිතව අවම පිරිවැයක් යටතේ රජයට අවශ්‍ය මූල්‍යනය සිදු කිරීම තහවුරු කිරීම සඳහා 2018 වසරේදී ප්‍රතිපත්ති ගණනාවක් හඳුන්වා දෙන ලද අතර, රාජ්‍ය ණය නිකුත් කිරීම, ණය සේවාකරණය සහ කළමනාකරණය විචක්ෂණශීලීව හා විනිවිදභාවයකින් යුතුව අඛණ්ඩව සිදු කළෙමු.

එක්සත් ජනපදයේ පොලී අනුපාතික ඉහළ යෑමත්, රාජ්‍ය මූල්‍යන අවශ්‍යතා ඉහළ යෑමත් මෙන්ම, දේශපාලනික අස්ථාවරභාවය හේතුවෙන් රාජ්‍ය ණය කළමනාකරණය කිරීමේදී 2018 වසර තුළදී අභියෝග කිහිපයකට මුහුණ පෑමට සිදු විය. විශේෂයෙන්ම, 2018 වසරේ අවසාන කාලයේදී රාජ්‍ය සුරැකුම්පත් මත එළදා අනුපාතික ඉහළ යෑමත් සහ කෙටිකාලීන හා මැදිකාලීන පරිණතවීම් සහිත සුරැකුම්පත් සඳහා වෙළඳපොළ ප්‍රමුඛතාව වැඩිවීමත් යන සාධක රාජ්‍ය ණය පිරිවැය මත බලපෑම් ඇති කරන ලද අතර, මැදිකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය යටතේ වන ඉලක්ක සපුරා ගැනීම සඳහා එය අහිතකර ලෙස බලපා ඇත.

රාජ්‍ය ණය සුරැකුම්පත් නිකුත් කිරීමේ ක්‍රියාවලියෙහි කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය තවදුරටත් ඉහළ නැංවීම සඳහා 2017 වසරේ ජූලි මාසයේදී හඳුන්වා දුන් නව භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමේ ක්‍රමය, නිකුතු පද්ධතියේ කාර්යසාධනය සහ වෙළඳපොළ සහභාගී වන්නන්ගේ ප්‍රතිචාර සැලකිල්ලට ගනිමින් 2018 වසරේ පළමු කාර්තුව අගදී සමාලෝචනය කරන ලදී. මෙහි තෙවන අදියර සක්‍රීය කිරීම සඳහා පූර්ව අවශ්‍යතාවක් ලෙස සැලකෙන වඩාත් වෙළඳපොළ මත පදනම් වූ පිළිගැනීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම ඇතුළු වැඩිදියුණු කිරීම් කිහිපයක් 2019 වසරේ පළමු කාර්තුව අවසානය වන විට භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමේ පද්ධතියට හඳුන්වා දීමට නියමිතය.

තවද, සාමාන්‍යයෙන් රාජ්‍ය ණය සුරැකුම්පත් වෙළඳපොළෙහි මෙන්ම, ප්‍රාථමික වෙන්දේසි ක්‍රියාවලියෙහි විනිවිදභාවය හා පුරෝකථනය කිරීමේ හැකියාව ඉහළ නැංවීමේ අරමුණින්

භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර වෙන්දේසි සඳහා දින දර්ශනයක් අප විසින් ප්‍රකාශයට පත් කරනු ලැබීය.

2019 වසරේදී වෙළඳපොළ සහ ණය කළමනාකරණය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් ගැනීමට අපි අදහස් කර සිටිමු. 2018 මාර්තු මාසයේදී සක්‍රිය වගකීම් කළමනාකරණ පනත ක්‍රියාවට නැංවීමත් සමඟ දේශීය සහ විදේශීය වෙළඳපොළ තුළ වගකීම් කළමනාකරණ කාර්යයන් සඳහා අවශ්‍ය පසුබිම අපි සකස් කළෙමු. මුදල් අමාත්‍යාංශයේ සහයෝගයද සහිතව අනාගත ණය ලබාගැනීම් සඳහා වගකීම් කළමනාකරණ ක්‍රමවේද ක්‍රියාවට නැංවීමට අප දැනටමත් කටයුතු කරමින් සිටින අතර, අනාගත ණය වගකීම් සපුරාලීම සඳහා ණය ලැබීම් ඒ සඳහා පමණක්ම වෙන් කරන ලද ගිණුමක් තුළ පවත්වා ගැනීම සඳහා කටයුතු කෙරේ.

ද්විතීයික වෙළඳපොළ තුළ කටයුතුවල විනිවිදභාවය වැඩිදියුණු කිරීම සහ වෙළඳපොළ ක්‍රියාකාරිත්වය ඉහළ නැංවීමට භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම සඳහා නව ප්‍රාථමික නිකුත් කිරීමේ පද්ධතියක් හඳුන්වා දීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වූ ද්විතීයික වෙළඳපොළ තවදුරටත් වැඩිදියුණු කිරීමට අවශ්‍ය නීතිමය සංශෝධන සමඟ රාජ්‍ය සුරැකුම්පත් සඳහා මධ්‍යම ප්‍රතිපාර්ශ්ව නිෂ්කාශනාගාරයක් (Central Counter Party/CCP) සහිත විද්‍යුත් හුවමාරු පහසුකමක් ස්ථාපනය කෙරෙනු ඇති අතර, ණය උපකරණවලට අදාළ ද්විතීයික වෙළඳපොළ තොරතුරු යෝජිත විද්‍යුත් හුවමාරු පහසුකම තුළින් සහ නිෂ්කාශනාගාරය හරහා සිදුකිරීමේ යාන්ත්‍රණයක් මේ අනුව ස්ථාපනය කෙරෙනු ඇත.

මීට අමතරව, බහු පාර්ශ්වික නියෝජිත ආයතනවල දායකත්වය ඇතිව මැදිකාලීන ණය කළමනාකරණ උපාය මාර්ගය තවදුරටත් වැඩිදියුණු කිරීමට කටයුතු කෙරේ. තවද, ණය කළමනාකරණ පද්ධතිය කාර්යක්ෂමව ක්‍රියාත්මක වීම තහවුරු කිරීම උදෙසා දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත සහ ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනත සඳහා සංශෝධන හඳුන්වා දීමට නියමිතය.

ශීඝ්‍රයෙන් වෙනස්වන ගෝලීය මූල්‍ය වෙළඳපොළ සැලකිල්ලට ගනිමින්, දැනට සමස්ත නොපියවූ රාජ්‍ය සුරැකුම්පත් තොගයෙන් සියයට 10 ක් වන රුපියල්වලින් නාමනය කරන ලද රජයේ සුරැකුම්පත් මත කෙරෙන විදේශ ආයෝජනවල උපරිම සීමාව සියයට 5 දක්වා අඩු කිරීමට අපි අපේක්ෂා කරන්නෙමු.

**සේවක අර්ථසාධක අරමුදල කළමනාකරණය**

ශ්‍රී ලංකාවේ විශාලතම විශ්‍රාම අරමුදල වන සේවක අර්ථසාධක අරමුදල (සේ.අ.අ.) සම්බන්ධව මුදල් මණ්ඩලයට පැවරී ඇති වගකීම් හා බලතල ප්‍රකාරව, සාමාජිකයන් වෙත ලබා දෙන ප්‍රතිලාභ ඉහළ නැංවීමත්, අරමුදලේ සුරක්ෂිතභාවය තහවුරු කිරීමත් ඇතුළුව සිය පාර්ශ්වකරුවන්ට සපයනු ලබන සේවා වැඩිදියුණු කිරීමට මහ බැංකුව කටයුතු කර ඇත.

2018 වසර තුළදී, වෙළඳපොළ තත්ත්වයන්ට ගැළපෙන පරිදි ආයෝජන උපායමාර්ගය හැඩගැස්වීම මගින් ප්‍රතිලාභ ඉහළ නැංවීම සඳහා සේ.අ.අරමුදලෙහි කළමනාකරණ කටයුතු අඛණ්ඩව සිදු කෙරිණ. ආයෝජන ක්‍රියාකාරකම්වල වගවීම හා විනිවිදභාවය ඉහළ නැංවීමේ අරමුණින්, සේ.අ.අරමුදලෙහි සමස්ත අවදානම් කළමනාකරණ රාමුව වැඩිදියුණු කිරීමට ද පියවර කිහිපයක් ගෙන ඇත. මෙම ක්‍රියාවලියෙහි එක් අංගයක් ලෙස, නව ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශයක් සහ ආයෝජන මාර්ගෝපදේශ හඳුන්වා දෙන ලදී. ආයෝජන කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා වූ සේ.අ.අ. ආයෝජන කමිටුවට අමතරව, සේ.අ.අ. ආයෝජන අධීක්ෂණ කමිටුවක් පිහිටුවීම මගින් සේ.අ.අ. අවදානම් කළමනාකරණය පිළිබඳ පාලන ව්‍යුහය ද ශක්තිමත් කරන ලදී.

ආසියානු සංවර්ධන බැංකුවේ සහාය ඇතිව අරමුදලෙහි ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම හා ක්‍රමවත් කිරීම සඳහා සේ.අ.අ. ක්‍රියාකාරකම් පිළිබඳ ව්‍යාපාර සමාලෝචන ක්‍රියාවලියක් අප විසින් සිදු කරන ලදී. මීට අමතරව, ලෝක බැංකුවේ සහාය ඇතිව සේ.අ.අ. ක්‍රියාකාරකම් ස්වයංක්‍රීයකරණය කිරීම සඳහා නව තොරතුරු තාක්ෂණ පද්ධතියක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී. වෙබ් අඩවිය පදනම් කරගත් සේවා සඳහා පහසුකම් සැපයීමේ අරමුණින් සේ.අ.අ. වෙබ් අඩවිය වැඩිදියුණු කරන ලද අතර, එය නුදුරේදීම දියත් කිරීමට අපේක්ෂා කෙරේ. සාමාජික තොරතුරු තත්කාලීනව තහවුරු කිරීම සහ සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලිය බලපත්‍රලාභී වාණිජ බැංකුවල මංගත ගෙවීම් පද්ධතිය හරහා 2018 වසරේදී අඛණ්ඩව සිදු කරන ලදී.

නව ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශයට සහ ආයෝජන මාර්ගෝපදේශවලට අනුගත වන අතරම, විවිධ ආයෝජන උපායමාර්ග තුළින් අවදානම් ගළපන ලද ඉහළ ප්‍රතිලාභයක් උත්පාදනය කිරීමට ඉදිරි කාලය තුළදී සේ.අ.අ. අපේක්ෂා කරයි. දිගුකාලීන ආයතනික ආයෝජකයෙකු

ලෙස, පුළුල් ආයෝජන විවිධාංගීකරණ ක්‍රියාවලියක් තුළින් නව වෙළඳපොළ අවස්ථා හා නව මූල්‍ය උපකරණ අත්පත් කර ගැනීමට සේ.අ.අ. අපේක්ෂා කරයි.

**විදේශ විනිමය කළමනාකරණය**

2017 අංක 12 දරන විදේශ විනිමය පනත හඳුන්වා දීමත් සමඟ විදේශ විනිමය ගනුදෙනු ලිහිල්කරණය වැඩිදියුණු විය. ඒ අනුව, විදේශ ආයෝජකයන්ගේ ප්‍රාග්ධන ගලා ඒම් සඳහා අදාළ ක්‍රියාවලි තවදුරටත් විධිමත් සහ සරල බවට පත් කරන ලද අතර, තෝරාගත් අංශවල නේවාසිකයන්ගේ ප්‍රාග්ධනය පිටතට ගලා යෑම් සඳහා පනවා ඇති සීමා තවදුරටත් පුළුල් කරන ලදී. ක්‍රියාවලියේ ඇති ප්‍රමාද දෝෂ මගහැරීම සඳහා විගමනික දීමනාව පැවරුම් කිරීමට බලයලත් වෙළඳුන්ට අවසර ලබා දෙමින් විදේශ විනිමය ගනුදෙනු ලිහිල් කිරීම යනාදිය මෙම නව නියාමන ක්‍රියාමාර්ගවලට ඇතුළත් වේ.

2017 විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද නව නියාමන, නියෝග සහ විධාන සඳහා පාර්ශ්වකරුවන් විසින් දක්වනු ලබන ප්‍රතිචාර සමාලෝචනය කිරීමේ ක්‍රියාවලියක අප නිරතව සිටින අතර, නියාමනවල පැහැදිලිභාවය වැඩිදියුණු කිරීම සඳහා තවදුරටත් එම නියාමන සරල කිරීමේ අරමුණ ඇතිව ඒවා යළි සලකා බැලීමට අපි අදහස් කරන්නෙමු.

ප්‍රතිපත්ති මත පදනම් වූ පර්යේෂණද සලකා බලා සාර්ව ආර්ථික විශ්ලේෂණ මත පදනම්ව ප්‍රාග්ධන ගනුදෙනු ලිහිල් කිරීම යළි සලකා බැලීම සඳහා පියවර ගැනීමට අපි අදහස් කරන්නෙමු. අවිධිමත් වෙළඳපොළ කටයුතු අවම කිරීමට සහ වෙළඳපොළ සාමාජිකයන් අතර හිතකර තරගකාරීත්වයක් ඇති කිරීම සඳහා මුදල් හුවමාරු ව්‍යාපාර සඳහා අවසර ලබා දීමට අවශ්‍ය නිර්ණායක සමාලෝචනය කිරීමටද අපි සැලසුම් කරන්නෙමු. විදේශ විනිමය මිලදී ගැනීම් සහ විකුණුම්වලට අදාළ දත්ත ග්‍රහණය කර ගැනීම සඳහා නවතම තත්කාලීන විදේශ විනිමය වාර්තා කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ පද්ධතියක් වැඩිදියුණු කිරීම මගින් අධීක්ෂණ කාර්යය තවදුරටත් ශක්තිමත් කෙරේ. රටවල් අතර සහ රට තුළ සිදු කරන විදේශ මුදල් ගනුදෙනුවලට අදාළ සියලු දත්ත ලබා ගැනීමේ අරමුණින්, පුළුල් ජාත්‍යන්තර ගනුදෙනු වාර්තා කිරීමේ පද්ධතියක් (International Transactions Reporting System/ITRS) ස්ථාපනය කිරීමට අපි අපේක්ෂා කරන්නෙමු.

මේ අතර, විනිමය ක්‍රියාකාරිත්වයට අදාළ අනවසර සහ නීති විරෝධී ක්‍රියා මැඩලීම සඳහා වන පැහැදිලි විධාන දැනට පවතින විදේශ විනිමය පනතේ නොමැති වීම හේතුවෙන්, අනවසර විදේශ විනිමය වෙළඳපොළ කටයුතු සුපරීක්ෂණය ශක්තිමත් කිරීම සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තුව බලාත්මක කරමින් විනිමය පාලන පනත සඳහා බලතල කිහිපයක් හඳුන්වා දීමට අපේක්ෂා කෙරේ.

**මූල්‍ය බුද්ධි ඒකකය**

මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමට එරෙහිව කටයුතු කිරීම සඳහා වන ජාතික ප්‍රතිපත්ති රාමුව ශක්තිමත් කිරීම සඳහා තවදුරටත් අප විසින් කටයුතු කරනු ඇත.

මූල්‍ය කාර්ය සාධන බලකාය සමඟ එකඟ වූ පරිදි ක්‍රියාකාරී සැලසුමේ යම් ප්‍රගතියක් අප විසින් අත්පත් කරගෙන ඇති අතර, 2019 වසරේ මැද භාගය වන විට මූල්‍ය කාර්ය සාධන බලකායේ "අළු ලේඛනයෙන්" ශ්‍රී ලංකාව ඉවත් කර ගැනීමට අපි අපේක්ෂා කරන්නෙමු.

ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, රක්ෂණ නියාමන කොමිසම සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වැනි ආයතන සමඟ අවබෝධතා ගිවිසුම්වලට එළැඹීම හරහා අපගේ කටයුතු තවදුරටත් ව්‍යාප්ත කර ඇත. එසේම, මූල්‍ය බුද්ධි සේවා වැඩිදියුණු කිරීම සඳහා සියලු පාර්ශ්ව සම්බන්ධීකරණය කරමින් සාධනීය ප්‍රතිපත්ති ගණනාවක්ම ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිතය.

**ප්‍රාදේශීය සංවර්ධනය**

රට තුළ සඵලදායී ලෙස ණය සැපයීම සහ මූල්‍ය අන්තර්ගතභාවය ඇති කිරීම තුළින් සර්වසම සහ තුලනාත්මක ආර්ථික වර්ධනයක් ඇති කිරීමේ අරමුණින්, නව සංවර්ධන මූල්‍ය ප්‍රතිපත්ති උපායමාර්ග 2018 වසර තුළදී අපි ක්‍රියාත්මක කළෙමු.

ණය පහසුකම් සේවා ගණනාවක් සැපයීමට අමතරව, නොයෙක් ප්‍රතිමූල්‍යන, පොලී සහනාධාර ක්‍රම සහ ණය ඇප ආවරණ යෝජනා ක්‍රම වැනි වැඩසටහන් තවදුරටත් සම්බන්ධීකරණය, පහසුකම් සැපයීම මෙන්ම ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදී. මෙම

වැඩසටහන් තුළින් රට පුරා විහිදී සිටින පුද්ගලයන්ට සහ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායකයන්ට දැරිය හැකි මට්ටමේ මූල්‍ය සේවා ලබාගත හැකි විය.

මූල්‍ය අන්තර්ගතභාවය ඉහළ නැංවීමේ අරමුණින්, විශේෂයෙන් විධිමත් මූල්‍ය අංශය සඳහා ප්‍රවේශ විය නොහැකි කණ්ඩායම් ඉලක්ක කොටගෙන මූල්‍ය සාක්ෂරතා සහ කුසලතා සංවර්ධන වැඩසටහන් මාලාවක් පවත්වන ලදී. 2019 වසරේදී මෙම කටයුතු තවදුරටත් ක්‍රියාත්මක කිරීම අපගේ අභිප්‍රාය වේ.

ඵලදායී සහ කාර්යක්ෂම ලෙස රටේ මූල්‍ය අන්තර්ගතභාවය ඉහළ නැංවීම සඳහා ජාතික මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ උපායමාර්ගය (National Financial Inclusion Strategy/ NFIS) සංවර්ධනය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම මෙහිදී ඉතා වැදගත් කාර්යයක් ලෙස සඳහන් කළ හැකිය. මේ සඳහා 2018 වසරේ ජනවාරි මාසයේදී ශ්‍රී ලංකා මහ බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව සමඟ සාමූහික එකඟතාවකට අත්සන් තබන ලදී. මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ උපායමාර්ගයෙහි එක් අංගයක් ලෙස, රටේ දැනට පවතින මූල්‍ය අන්තර්ගතභාවය සහ මූල්‍ය සාක්ෂරතාවයෙහි පසුබිම පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා දීප ව්‍යාප්ත සමීක්ෂණයක් පවත්වන ලදී.

කෘෂි, කාර්මික සහ සේවා යන අංශවල නිරත වන ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන්ට මූල්‍ය සේවා ලබා ගැනීමට ඇති හැකියාව සහතික කරමින්, නිෂ්පාදනය මත පදනම් වූ ආර්ථික කටයුතු සඳහා දිරිගැන්වීම් කරනු ලබන අතර, විධිමත් මූල්‍ය අංශයෙන් පරිබාහිර කණ්ඩායම් විධිමත් මූල්‍ය අංශය තුළට ගෙන එමින්, අන්තර්ගත හා තුලනාත්මක ආර්ථික වර්ධනයක් සඳහා උපකාර වීමට 2019 වසරේ මැද භාගය වන විට ජාතික මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ උපායමාර්ගය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

# 5. සමාප්ති සටහන

නෝනාවරුනි, මහත්වරුනි,

මෙම ප්‍රතිපත්ති පෙර දැක්මෙහි සමාප්ති සටහනට අප එළැඹ ඇත.

ආරම්භයේදී සඳහන් කළ පරිදි, 2018 වසරේදී ශ්‍රී ලංකාව විවිධ දුෂ්කරතා ගණනාවකට මුහුණ දුන් අතර, එය සාර්ව ආර්ථික ස්ථායීතාවට අහිතකර බලපෑම් ඇති කළේය. කෙසේ වෙතත්, ආපසු හැරී බැලීමේදී, එවැනි අභියෝග හා අවිනිශ්චිතතා මගින් ඇති වූ බලපෑම් අවම කිරීම සඳහා මහ බැංකුව සහ රජය විසින් තීරණාත්මක ලෙස මැදිහත් වෙමින් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගණනාවක් ක්‍රියාත්මක කළ බව සඳහන් කළ හැකිය. සමහර අංශවල අසමතුලිතතා පැවතියද, අප මුහුණ දුන් කම්පනවලට ඔරොත්තු දීම සඳහා මෙන්ම, පුළුල් ලෙස ආර්ථිකයේ ස්ථාවරත්වයක් ඇති කිරීමට මෙම ක්‍රියාමාර්ග උපකාර වූ බව පැහැදිලිය. කෙසේ වෙතත්, තවදුරටත් අභියෝග සහ තර්ජන පවතින බව අප වටහාගෙන ඇති අතර, සමස්ත සාර්ව ආර්ථික සහ මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය මත තවදුරටත් පීඩනයක් ඇති කළ හැකි අවදානම් රාශියක් ද පවතී. මෙම අභියෝග අවම කර ගැනීමටත් අවසානයේදී අප ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා පරිසරයක් නිර්මාණය කිරීමටත් හැකිවන පරිදි මිල, ආර්ථික සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව සාක්ෂාත් කර ගැනීම සඳහා අපගේ ආර්ථිකය හා මූල්‍ය ක්ෂේත්‍රය නිවැරදි දිශාවකට යොමු කර ගැනීමට පූර්වෝපායික සහ සඵලදායි ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහය වනු ඇති බව අපි විශ්වාස කරන්නෙමු. වර්තමානයේ පවතින නිතර වෙනස්වන සුළු සහ අවිනිශ්චිත පරිසරය තුළ කිසියම් අවශ්‍යතාවක් පැන නැඟුණහොත්, නිසි ප්‍රතිපත්ති හඳුන්වා දීමට සහ ප්‍රතිපත්තිවල වෙනස්කම් සිදු කිරීමටත් අපි සූදානම් වී සිටිමු.

මෙම ප්‍රතිපත්ති ප්‍රකාශය අවසන් කිරීමට ප්‍රථමයෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ කටයුතුවලට නිරන්තරයෙන් සහය දක්වන පුද්ගලයන් හා පාර්ශ්වයන් වෙත මාගේ කෘතවේදීත්වය හා ගෞරවය පළ කිරීම මාගේ වගකීමයි. පළමුවෙන්ම, අතිගරු ජනාධිපතිතුමා සහ ගරු අග්‍රාමාත්‍යතුමා විසින් දෙනු ලැබූ නායකත්වය හා මග පෙන්වීම සඳහා මම අතිශයින්ම කෘතඥ වෙමි. එසේම, විශේෂයෙන්ම, මුදල් අමාත්‍යාංශය සහ මහ බැංකුව අතර සමීප සම්බන්ධීකරණයක් තහවුරු කරමින් මහ බැංකුවේ ස්වාධීනත්වය ශක්තිමත් කිරීම සඳහා දෙන ලද සහාය වෙනුවෙන් ගරු මුදල් ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙමි.

තවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩල සාමාජිකයන් විසින් දක්වන ලද සහයෝගය මෙන්ම, ඔවුන්ගේ ඵලදායී සාකච්ඡා සහ අදහස් වෙනුවෙන් මාගේ විශේෂ කෘතඥතාව පිරිනමමි. 2018 වසර තුළදී මුදල් මණ්ඩල සාමාජිකයන් ලෙස සේවය කළ භාණ්ඩාගාර ලේකම්වරුන්ට මාගේ හෘදයාංගම ඇගයීම හිමිවේ. එසේම, මුදල් මණ්ඩල සාමාජිකයන් ලෙස මනෝහාරී රාමනාදන් මහත්මිය, ක්‍රිශාන්ත පෙරේරා මහතා සහ නිහාල් ෆොන්සේකා මහතා ලබා දුන් වටිනා මෙන්ම, සුවිශේෂ සහාය පිළිබඳ මම කෘතඥ පූර්වක වෙමි. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා සහ නියෝජ්‍ය අධිපතිවරුන් වන, කේ ඩී රණසිංහ මහතා, එස් ආර් ආටිගල මහතා සහ එච් ඒ කරුණාරත්න මහතාට ද මම ස්තුතිවන්ත වෙමි. ඔවුන් විසින් මා හට ලබා දුන් ඉහළ වෘත්තීයමය උපදෙස් සහ ඔවුන් පළ කළ විශිෂ්ට තාක්ෂණික ප්‍රවීණත්වයද මෙම ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස මා හට ඵලදායීව, රාජකාරි ඉටු කිරීම සඳහා උපකාර විය. බැංකු සේවයෙන් පසුගිය වසරේ දී විශ්‍රාම ගන්නා ලද හිටපු නියෝජ්‍ය අධිපති සී ජේ පී සිරිවර්ධන මහතා විසින් කරන ලද විශිෂ්ට සේවය ද මෙහිදී සඳහන් කිරීමට මම කැමැත්තෙමි.

මුදල් ප්‍රතිපත්ති උපදේශන කමිටුව, මූල්‍ය පද්ධති ස්ථායිතා උපදේශන කමිටුව මෙන්ම මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ සාමාජිකයන් විසින් ලබා දුන් වටිනා අදහස් හා යෝජනා පිළිබඳව ද මම ස්තුතිවන්ත වන අතර, එය අපගේ ප්‍රතිපත්ති සහ මෙහෙයුම් වඩාත් හොඳින් ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂයෙන් දායක විය.

අවසාන වශයෙන් සහ වඩාත්ම වැදගත් වශයෙන්, මෙම ප්‍රතිපත්ති ප්‍රකාශය සකස් කිරීම සඳහා ගත් උත්සාහය වෙනුවෙන් සහකාර අධිපතිවරුන්ට, ජ්‍යෙෂ්ඨ දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට, විශේෂයෙන් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරිය සහ කාර්ය මණ්ඩලයට මාගේ අවංක ස්තුතිය ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි. තවද, මා හට නිතිපතා සහය වන අධිපති ලේකම් දෙපාර්තමේන්තුවේ මාගේ සහෝදර කාර්ය මණ්ඩලය ද මෙහිදී මම සිහිපත් කරමි. ඔවුන්ගේ සහාය නොමැතිව, මාගේ කටයුතු මේ අයුරින් ඉටු කිරීම දුෂ්කර වනු ඇත.

මාගේ අදහස වන්නේ මහ බැංකුව සතු වටිනාම වස්තුව එහි කාර්ය මණ්ඩලය බවයි. ඔවුන් නොමැතිව අපගේ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට හා රට වෙනුවෙන් අපගේ අරමුණු වෙත ළඟා වීමට නොහැකි වනු ඇත. වෘත්තීයවේදීත්වයෙන්, තාක්ෂණික විශිෂ්ටත්වයෙන් සහ

අවංකභාවයෙන් යුතුව සහ විශේෂයෙන්, විවිධ බාධක මධ්‍යයේ වුවද ඉතා උද්යෝගීමත් භාවයකින් යුතුව ජාතික කර්තව්‍යක් ඉටු කරන මහ බැංකු කාර්ය මණ්ඩලයට මම ස්තූතිවන්ත වෙමි.

ආර්ථික විද්‍යා මහාචාර්යවරයෙකු සහ ෆෙඩරල් සංචිත බැංකුවේ අධිපති මණ්ඩලයේ හිටපු සභාපතිවරයෙකු වන බෙන් බර්නන්කේ උපුටා දක්වමින් මාගේ ප්‍රකාශය අවසන් කිරීමට කැමැත්තෙමි. “ප්‍රතිපත්ති වෙනස් විය හැකි ආකාරය පිළිබඳව මහ බැංකුවක් විසින් මහජනතාව වෙත ඉහළ මාර්ගෝපදේශනයක් ලබාදෙන විට, වෙළඳපොළ සහභාගි වන්නන් විසින් ඊට ගැළපෙන පරිදි අනුමාන සිදු කිරීමේ වැඩි ඉඩ ප්‍රස්ථාවක් ඇත”.

අපගේ ආර්ථිකයෙහි අඛණ්ඩ ස්ථාවරත්වයක් සහතික කිරීම සඳහා මුදල් හා මූල්‍ය ක්ෂේත්‍රයට අදාළව අද දින ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්ති සහ සැලසුම් දායක වනු ඇතැයි මම විශ්වාස කරමි. පාර්ශ්වකරුවන් ලෙස ඔබගේ සහයෝගය නොමැතිව එම ප්‍රතිපත්තිවල සඵලදායිත්වය හා සාර්ථකත්වය සාක්ෂාත් කරගත නොහැකි වනු ඇති අතර, පසුගිය වසර හා අතීතයේ ලබාදුන් පරිදි ඔබගේ උපරිම සහයෝගය හා දායකත්වය තවදුරටත් ඉදිරියට ලබාදෙනු ඇතැයි මම විශ්වාස කරමි.

ස්තූතියි.

ඔබ සැමට 2019 වසර සෞභාග්‍යමත් සුබ නව වසරක් වේවා යැයි ප්‍රාර්ථනා කරමි.